



වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2021

ජාතික අධ්‍යාපන ආයතනය

தேசிய கல்வி நிறுவகம்

NATIONAL INSTITUTE OF EDUCATION

පටුන	පිටුව

1.	ජාතික අධ්‍යාපන ආයතනයේ දැක්ම, මෙහෙවර හා ඉලක්ක	01
2.	හැඳින්වීම හා ප්‍රගතිය	02
3.	විගණකාධිපති වාර්තාව	27
4.	විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව	33
5.	මූල්‍ය වාර්තා	44

ජාතික අධ්‍යාපන ආයතනයේ දැක්ම, මෙහෙවර සහ ඉලක්ක



විසි එක් වැනි සියවසෙහි හා ඉන් ඔබ්බෙහි අභියෝගවලට මුහුණ දීමට සුදානමින් යුත් උසස් ගුණාත්මයෙන් හෙබි මානව ප්‍රාග්ධනයක් සංවර්ධනය කරන්නා වූ සාමාන්‍ය අධ්‍යාපනයේ විශිෂ්ටත්ව කේන්ද්‍රය බවට පත් වීම.



විසි එක් වැනි සියවස හා සිව් වැනි කාර්මික විප්ලවය සඳහා අභිවර්ධිත පාසල් පද්ධතියක් වෙනුවෙන් විෂයමාලා සංවර්ධන, ශික්ෂණ විද්‍යා මැදිහත් වීම් සහ තක්සේරුකරණය මගින් මානව ප්‍රාග්ධනයක් හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නායකයන් සංවර්ධනය කිරීම.



1. ප්‍රතිසංශෝධිත සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලා රාමුවක් (විෂය නිර්දේශ ශික්ෂණ විද්‍යා තක්සේරුකරණ)
2. අනුයුක්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල ද සමග සාමාන්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෘත්තීය විශ්ව විද්‍යාලයක් ලෙස අභිවර්ධිත ජාතික අධ්‍යාපන ආයතනයක්
3. සුදුසුකම් ලත් කාර්යමණ්ඩලයක් ආකර්ෂණය කරගන්නා හා රඳවා ගන්නා වූ ජාතික අධ්‍යාපන ආයතනය පිළිබඳ උසස් ප්‍රතිරූපයක්
4. අධ්‍යාපනයේ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල ගුණාත්මයේ ඉහළ නැංවීමක්
5. අධ්‍යාපන ප්‍රතිපත්ති, විෂයමාලාව, අධ්‍යාපන කළමනාකරණය හා තුලනාත්මක අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණවල ප්‍රවර්ධනයක්
6. නව තාක්ෂණය භාවිතයෙන් වැඩි දියුණු කරන ලද සේවා සැපයුමක්
7. මානව ප්‍රාග්ධන සංවර්ධනයෙහි සහ පද්ධති, පටිපාටි හා යටිතල පහසුකම්වල ප්‍රගතියක්

හැඳින්වීම හා ප්‍රගතිය

හැඳින්වීම

1985 අංක 29 දරන පාර්ලිමේන්තු පනතට අනුව 1986 දී ස්ථාපිත කරන ලද ජාතික අධ්‍යාපන ආයතනය වෙත ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ සංවර්ධනයට අදාළ සැලසුම්, වැඩසටහන් සහ වෙනත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අධ්‍යාපන ඇමතිවරයාට උපදෙස් ලබා දීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන, සමාජ ආර්ථික සන්දර්භයට උචිත, විෂයමාලාවක් මගින් ඵලදායී පුරවැසියන් බිහි කිරීම තුළින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීම, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීම ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක විධි ක්‍රම ඔස්සේ තහවුරු කරගත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත.

ආයතනයට පැවරී ඇති කාර්ය සැලසුම් කිරීමේ දී හා ඉටු කිරීමේ දී පනතෙහි දක්වා ඇති පහත සඳහන් අරමුණු 8 ඒ සඳහා ප්‍රතිෂ්ඨාධාරක ලෙස ඉවහල් කරගනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) අධ්‍යාපනය හා අදාළ විශේෂිත ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපන අවස්ථා සැලසීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම;

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධි ක්‍රම ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජ, ආර්ථික සහ වෙනත් අංශ අනාවරණය කර ගැනීම සඳහා අධ්‍යයන පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා තාක්ෂණික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැළි කාර්ය මණ්ඩලවල වෘත්තීය සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂඥ සේවා ලබා දීම;

(උ) විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් අධ්‍යාපන සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම;

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

සෑම අවුරුදු 08 කට වරක් ම පාසල් විෂයමාලා සංශෝධනයක් හෝ ප්‍රතිසංස්කරණයක් හෝ ක්‍රියාත්මක කිරීම, ශ්‍රී ලංකාවේ දැනට පවතින විෂයමාලා ප්‍රතිපත්තියයි. ඊට අදාළව විෂයමාලා සංශෝධනයක් හෝ ප්‍රතිසංස්කරණයක් හෝ ක්‍රියාත්මක වීමට නියමිත වන්නේ 2023 වසරේදී ය. නමුත් වසර 12කින් පමණ පූර්ණ විෂයමාලා ප්‍රතිසංස්කරණයක් සිදුකර නොමැති බැවින් පාසල් විෂයමාලාව පරිපූර්ණ නවීකරණයකට භාජනය කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි ජාතික අධ්‍යාපන ආයතනයේ පූර්ණ අවධානය යොමුවිය. ඒ අනුව 21වන සියවසට අදාළ නිපුණතාවලින් හෙබි, 4වන කාර්මික විප්ලවයට අදාළ අභියෝගවලට මුහුණ දීමට සමත් දරුවෙකු පාසල් අධ්‍යාපනයෙන් බිහි

කිරීමේ මූලික අරමුණින් යුතුව ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

පන්ති කාමරයේ සිසුන් ස්වයං ඉගෙනුමට යොමු වන පරිදි මොඩියුල පාදකව, සමාසික (Semester) ක්‍රමයට අනුව විෂයමාලා සම්පාදනය කිරීමත්, සුසත්‍ය (Authentic) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පන්ති කාමරය තුළ ස්ථාපිත කිරීමත්, සම්භවන ඇගයීමට වඩා සම්පිණ්ඩිත තක්සේරුව මගින් දරුවාගේ තක්සේරු කිරීම ප්‍රවර්ධනය කිරීමටත් නව විෂයමාලා ප්‍රතිසංස්කරණ මඟින් අපේක්ෂිතය. ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලා අරමුණු 6ක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් පහත පරිදි හඳුනා ගන්නා ලදී. අවුරුදු 13 ක පාසල් අධ්‍යාපනය අවසන් කරන ශිෂ්‍යයා;

- තිරසර ජාතික සංවර්ධනයට සක්‍රීය දායකත්වයක් සපයන්නකු වීම.
- ඵලදායී, කාර්යක්ෂම හා වැඩ නැඹුරු පුරවැසියකු වීම.
- ව්‍යවසායකයකු හෝ ව්‍යවසායකත්ව මානසිකත්වයක් ඇති පුද්ගලයෙකු වීම.
- දේශප්‍රේමී පුරවැසියෙකු වීම.
- හොඳ මිනිසෙකු වීම.
- ප්‍රීතිමත් පවුලක සාමාජිකයෙකු වීම

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ජාතික විෂයමාලා රාමුවක් සකස් කරන ලද අතර, එය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රධානත්වයෙන් ආරම්භ කර ඇත. නව ජාතික විෂයමාලා ප්‍රතිපත්ති රාමුව වත්මන් විෂයමාලාවෙන් උගත් පාඩම් සහ ගෝලීය යහපත් භාවිතයන් මෙන්ම ජාතික සංවර්ධන උපාය මාර්ගයේ ප්‍රමුඛතා පිළිබිඹු කරමින් නව සාමාන්‍ය අධ්‍යාපන විෂයමාලාවක් සැකසීමට පදනමක් සපයයි.

මූල්‍ය සැපයීම

ආයතනික වියදම් පියවා ගැනීම සඳහා මූලාශ්‍ර කිහිපයක අරමුදල් යොදා ගැනේ. අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව විෂයමාලා සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මූලික වශයෙන් ආවරණය කරනු ලැබුවේ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය මගින් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල ආදී මූලාශ්‍ර කිහිපයක අරමුදල් මගිනි. රජයෙන් ලබාදෙන පුනරාවර්තන ප්‍රදානය මූලිකවම කාර්ය මණ්ඩල වැටුප් හා වේතන ගෙවීම සඳහා යොදවන ලද නමුත්, ආයතනයේ එදිනෙදා වියදම් හා බිල්පත් ගෙවීම සඳහා යොදා ගන්නා ලද්දේ ආයතනය විසින් මෙහෙයවනු ලබන ව්‍යාත්තීය සංවර්ධන පාඨමාලා වලින් ලබා ගන්නා ආදායමයි. නව ගොඩනැගිලි ඉදිකිරීම, පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම, යන්ත්‍රෝපකරණ සහ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම ආදී ප්‍රාග්ධන වියදම්වලට මූලික වශයෙන් යොදාගනු ලැබුවේ ආයතනික ආදායම් හා රජයේ ඒකාබද්ධ අරමුදලෙන් ලැබෙන ප්‍රදාන වේ. ඊට අමතරව ලෝක බැංකු ආධාර මගින් ද ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ යම් ප්‍රමාණයක් මිල දී ගැනීම සිදු කරන ලදි. 2021 වර්ෂයේ ආයතනයේ ප්‍රතිපාදන හා වියදම් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

මූල්‍ය ප්‍රභවය	පුනරාවර්තන වියදම (රු. මිලියන)		ප්‍රාග්ධන වියදම් (රු.මිලියන)	
	සංශෝධිත ප්‍රතිපාදන	තථ්‍ය වියදම	සංශෝධිත ප්‍රතිපාදන	තථ්‍ය වියදම
ඒකාබද්ධ අරමුදල	550,000,000	501,857,388	124,000,000	122,397,774
සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය	132,500,000	119,991,903	67,500,000	33,008,097
ඒකාබද්ධ අරමුදල (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය) - විෂයමාලා ප්‍රතිසංස්කරණ	200,500,000	117,822,578	29,500,000	14,500,000
ඒකාබද්ධ අරමුදල (අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය) - ගුරු ගෙදර	150,000,000	121,573,758	0	0
ජාතික අධ්‍යාපන ආයතනය උපයනු ලබන ආදායම	341,425,000	287,769,417	237,255,000	225,722,417
එක්සත් ජාතීන්ගේ ළමා සංවර්ධන අරමුදල	9,719,000	3,541,703	0	0
යුනෙස්කෝව සඳහා වූ කොරියානු ජාතික කොමිසම	6,312,000	6,282,841	0	0
විදේශ ප්‍රදාන (පොදු රාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය)	1,406,000	1,392,415	0	0
එකතුව	**1,391,862,000**	**1,160,232,003**	**458,255,000**	**391,628,288**

කාර්ය මණ්ඩලය

ඉහත සඳහන් කර ඇති ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනය විසින් පීඨ 5ක් හා එක් අංශයක් විසින් සංවිධානය කර මෙහෙයවනු ලබන සේවකයින් 450කට අධික කාර්ය මණ්ඩලයක් සේවයෙහි නියුක්තව ඇත. ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත සඳහන් වගුවේ දක්වා ඇත. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් සහ මාර්ගෝපදේශ යටතේ, ජාතික අධ්‍යාපන ආයතනයෙහි කළමනාකාරීත්වය 2021 අවසානය වන විට සියලුම පුරප්පාඩු පිරවීමට මූලික පියවර ගෙන ඇත.

2021 වර්ෂය අවසාන වනවිට ආයතනයේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.


තනතුර	2021.01.01 දිනට අනුමත කාර්ය මණ්ඩලය	2021.12.31 දිනට වර්තමාන කාර්ය මණ්ඩලය			2021.12.31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
		පිරිමි	ගැහැනු	මුළු	
අධ්‍යක්ෂ ජනරාල්	01	1	0	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	0	0	0	1
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	06	5	1	6	0
අධ්‍යක්ෂ	27	14	7	21	6
සභා ලේකම් (අධ්‍යාපන)	01	0	0	0	1
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ	72	22	33	55	17
කථිකාචාර්ය / අධ්‍යාපනඥ	75	5	4	9	66
සහකාර කථිකාචාර්ය / සහකාර අධ්‍යාපනඥ	90	30	44	74	16
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	379	129	157	286	95
මුළු සංඛ්‍යාව	**652**	**206**	**246**	**452**	**202**

2021 වර්ෂයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමට කිහිප වතාවක් වෑයම් කළද, කථිකාචාර්ය පුරප්පාඩු 66ක් ඇතුළු ශාස්ත්‍රීය අංශයේ පුරප්පාඩු 107ක් තවමත් ඇත.

සුදුසුකම් අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය

2021 වර්ෂය අවසාන වන විට සුදුසුකම් අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තත්ත්වය පහත රූපයෙන් පෙන්නුම් කෙරේ.

සුදුසුකම	සංඛ්‍යාව
දර්ශනසූරි	17
දර්ශනපති	12
අධ්‍යාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති/ ව්‍යාපාර පරිපාලනපති/ ගුරු අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති	120
අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා	6
ප්‍රථම උපාධි	12



2021 ආයතන සභාව

ආයතන සභාව උත්තරීතර පාලන ආයතනය වන අතර, 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 7 වැනි වගන්තියේ විධි විධාන අනුව ආයතනයේ පරිපාලන, කළමනාකරණ හා පාලන කටයුතු ආයතන සභාව වෙත පැවරී ඇත. ආයතන සභාවේ සාමාජිකත්වය පිළිබඳ තොරතුරු උක්ත පනතේ 7 වැනි වගන්තියේ දක්වා ඇත.

පහත සඳහන් සාමාජිකයන් 2021 වර්ෂයේ පාලක සභාවේ ක්‍රියා කොට ඇත.

මහාචාර්ය කපිල පෙරේරා මහතා	-	*සභාපති*
(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)		*(2022.05.25 දක්වා)*
ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා	-	*සාමාජික*
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)		
ආචාර්ය උපාලි සේදර මහතා	-	*සාමාජික*
(ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය)		
මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා	-	*සාමාජික*
(ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති)		
මහාචාර්ය එම්.එස්.එම්.අනිස් මහතා	-	*සාමාජික*
(විශ්‍රාමික මහාචාර්ය) දර්ශන අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)		

මහාචාර්ය ජී.ඩී. ලේකම්ගේ	-	*සාමාජික*
(සභාපති මහාචාර්ය (විශ්‍රාමික), ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය)		
අජිතා බටගොඩ මහත්මිය	-	*සාමාජික*
(අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය)		*(2022.03.18 දක්වා)*
එම්.පී.සී.එම්. මුතුකුමාරණ මහතා (ජ්‍යෙෂ්ඨ නීතිඥ)	-	*සාමාජික*
මහාචාර්ය එච්. අබේගුණවර්ධන මහතා	-	*සාමාජික*
(සභාපති, ජාතික අධ්‍යාපන කොමිසම)		
ආචාර්ය අයි.එල්. ගිනිගේ මහත්මිය	-	*සාමාජික*
(හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය)		
ටී.බී.එම්. අතපත්තු මහතා	-	*සාමාජික*
(අතිරේක ලේකම් (පරිපාලන සහ මුදල්), උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)		
ඩී.එල්.පී.සී. සේනානායක මහත්මිය	-	*ලේකම්*
		(කොන්ත්‍රාත් පදනම මත)

ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය

ආයතන සභාවට අමතරව, අධ්‍යාපන කළමනාකරණය, පරිපාලනයට සහ වෙනත් අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයින්ගෙන් සැදුම්ලත් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ආයතනයේ සියළු ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් වගකීම දරයි. ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ බලතල, වගකීම් සහ ක්‍රියාකාරීත්වය ජාතික අධ්‍යාපන ආයතන පනතේ 10වන කොටසේ දක්වා ඇත.
2021 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය පහත සඳහන් අධ්‍යාපන විශේෂඥයින්ගෙන් සමන්විත විය.

මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා	-	*සභාපති*
(උප කුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)		
ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා	-	*සාමාජික*
(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)		
මහාචාර්ය හුසේන් ඉස්මයිල් මහතා	-	*සාමාජික*
(හිටපු උපකුලපති, අග්නිදිග විශ්වවිද්‍යාලය)		*(2021.03.09 දක්වා)*
ආචාර්ය එස්. රාජදුරෙයි මහතා	-	*සාමාජික*
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව,		
කොළඹ විශ්වවිද්‍යාලය)		
ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා	-	*සාමාජික*
(ලේකම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව)		
ආචාර්ය ලක්ෂ්මන් ජී. වෙඩික්කාරගේ මහතා	-	*සාමාජික*
(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව,		
කොළඹ විශ්වවිද්‍යාලය)		
ඊ.එම්.එස්. ඒකනායක මහතා	-	*සාමාජික*

(ප්‍රධාන කොමසාරිස් - ගුරු අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය)		*(2021.10.26 දක්වා)*
බී. සනත් පූජිත මහතා	-	*සාමාජික*
(විභාග කොමසාරිස් ජනරාල්)		*(2021.11.16 දක්වා)*
එල්.එම්.ඩී. ධර්මසේන මහතා	-	*සාමාජික*
(විභාග කොමසාරිස් ජනරාල්)		*(2021.12.15 සිට)*
එච්.යූ. ප්‍රේමතිලක මහතා	-	*සාමාජික*
(අතිරේක ලේකම්, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන, අධ්‍යාපන අමාත්‍යාංශය)		
මහාචාර්ය එම්.බී. රණතිලක මහතා	-	*සාමාජික*
(ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)		
ආචාර්ය එස්.ඒ.ඩී. සමරවීර මහතා	-	*සාමාජික*
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය		
කේ. රංජිත් පත්මසිරි මහතා	-	*සාමාජික*
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විද්‍යා හා තාක්ෂණ පීඨය)		
එන්.වී.ඒ.එස් සමරසිංහ මහතා	-	*සාමාජික*
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය)		
ඩී. ඒ. ජයලාල් මහතා	-	*සාමාජික*
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය)		
ආචාර්ය වී.ඩී.සී.පී. පෙරේරා මහත්මිය	-	*සාමාජික*
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - පර්යේෂණ, සැලසුම් හා		*(2021.02.17 දක්වා)*
සංවර්ධන පීඨය) එම්.පී.ආර්. ධනවර්ධන මහත්මිය	-	*සාමාජික*
(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ, සැලසුම් හා සංවර්ධන පීඨය)		*(2021.07.05 සිට))*
ඩී.එල්.පී.සී. සේනානායක මහත්මිය	-	*ලේකම්*
		(කොන්ත්‍රාත් පදනම මත)

ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ මගපෙන්වීමටත්, අධීක්ෂණයටත් යටත්ව සංවිධානාත්මක ව්‍යූහය යටතේ ජාතික අධ්‍යාපන ආයතනයට පවරන ලද කාර්යභාරයන් ක්‍රියාත්මක වේ.

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලයට අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, අභ්‍යන්තර විගණන අංශය සහ විභාග දෙපාර්තමේන්තුව අයත් වේ. ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සඳහා අවශ්‍ය ලේඛන සකස් කිරීම සහ බෙදා හැරීම, වාර්තා පවත්වාගෙන යාම

සහ ආයතන සභාවේ සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ තීරණ අදාළ පීඨවලට හා අංශවලට දැනුම් දීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වෙත පැවරී ඇත. පසුගිය වර්ෂය තුළ ආයතන සභා රැස්වීම් 10ක් ද, ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 13ක් ද ඒකාබද්ධ රැස්වීමක් ද පවත්වා ඇත. ඊට අමතරව ශාස්ත්‍රීය කටයුතු සමාලෝචන කමිටු රැස්වීම් 14ක් ද, විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් ද, මුදල් කමිටු රැස්වීම් 06ක් ද පවත්වා ඇත.

ප්‍රමිති පවත්වා ගනිමින් කාර්යක්ෂම හා ඵලදායී තක්සේරු ක්‍රමයක් ස්ථාපනය කිරීමේ වගකීම විභාග දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබේ. ජාතික අධ්‍යාපන ආයතනය, විවිධ වෘත්තීය සංවර්ධන පාඨමාලා පවත්වාගෙන යනු ලබන බැවින් සහතික කිරීමේ අරමුණ ඇතිව කාර්යක්ෂම ඵලදායී විභාග පද්ධතියක් පවත්වාගෙන යනු ලැබේ. 2021 වර්ෂය තුළ දෙපාර්තමේන්තු විසින් පහත විභාග පැවැත්වීම, ඇගයීම සහ සහතික කිරීම පිළිබඳ කටයුතු කොට ඇත.

- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2020 (පූර්ණ කාලීන) - සමාසික 1 (මාර්ගගත)
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2020 (පූර්ණ කාලීන) - සමාසික 2 (මාර්ගගත)
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2020 (පූර්ණ කාලීන) - සමාසික 3 (මාර්ගගත)
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම ඩිප්ලෝමාව 2020 අවසාන විභාගය
- සංඥා භාෂාව පිළිබඳ ඩිප්ලෝමාව 2019 - අවසාන විභාගය
- ගණිතය ඉගැන්වීමේ උසස් සහතික පාඨමාලාව 2019 - අවසාන විභාගය
- විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමාව 2019 - අවසාන විභාගය
- අධ්‍යාපනවේදී උපාධිය (සාමාන්‍ය 2017/2020) - දෙවන කොටස විභාගය
- පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (2019 / 2020) සමාසික 3 (මාර්ගගත)
- දෙවන ජාතික භාෂාව සිංහල/දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව (2019 / 2020) අවසාන විභාගය
- අධ්‍යාපනවේදී උපාධිය (2011/2013) පළමුවන කොටස - පුනර් පරීක්ෂණ විභාගය
- අධ්‍යාපනවේදී උපාධිය - ඉංජිනේරු තාක්ෂණය (2016/2019)- තුන්වන කොටස විභාගය
- අධ්‍යාපනවේදී උපාධිය (ගෞරව 2017/2021) - දෙවන කොටස විභාගය
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පූර්ණ කාලීන / අර්ධ කාලීන) පුනර්පරීක්ෂණය සමාසික 1
- අධ්‍යාපනපති උපාධිය (2019/2021) අවසාන විභාගය

බාහිර විභාග

- මධ්‍යම පරිසර අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවාගැනීමේ සීමිත තරග විභාගය (2021)
- කෘෂිකර්ම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරීන් සහ කාර්මික සහායකයින් තෝරා ගැනීමේ විභාගය

- ඉගැන්වීම පිළිබඳ ජාතික ඩිප්ලෝමා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (2017/2019) - අවසාන විභාගය (මාර්ගගත)
- ගුරු අභ්‍යාස විද්‍යාල අවසාන (අභ්‍යන්තර) විභාගය 2021

අභ්‍යන්තර විගණන අංශය සෘජුවම ආයතන ප්‍රධානියා වෙත වාර්තා කරයි. ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රියාත්මක වීම අධීක්ෂණය මෙම ඒකකයෙන් ඉටු වේ. අභ්‍යන්තර විගණන ඒකකය, විගණන වාර්තා 12ක් ද, විවිධ දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරන ලද 2021 වර්ෂයේ දී කරන ලද රු. 75000/-ට වැඩි ගෙවීම්වලට අදාළ ලිපිගොනු සහ රු. 250,000 වැඩි වැඩමුළු ඇස්තමේන්තුව ද පරීක්ෂා කරන ලදී.

2021 වර්ෂය තුළ ජාතික අධ්‍යාපන ආයතනය සපුරා ඇති විශේෂ ක්‍රියාකාරකම්

- ෆින්ලන්තයේ හෙල්සින්කි විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන විද්‍යා පීඨයේ උප පීඨාධිපති වූ මහාචාර්ය ලීනා කොන්ක්ර්ස් විසින් "ෆින්ලන්තයේ අධ්‍යාපන පද්ධතිය, ශ්‍රී ලාංකීය අධ්‍යාපනය සඳහා යොදා ක්‍රියාත්මක කළ හැක්කේ කෙසේද " යනුවෙන් තෙදිනක වැඩමුළුවක් පවත්වන ලදී. වැඩමුළුව ප්‍රධාන වශයෙන් යොමුවූයේ, ශ්‍රී ලාංකීය අධ්‍යාපනඥයින්, විෂයමාලා සම්පාදකයින් සහ අදාළ නිලධාරීන්ට යෝජිත විෂයමාලා ප්‍රතිසංස්කරණ සඳහා ලෝකයේ විශිෂ්ටතම අධ්‍යාපන පද්ධතිය ලෙස හඳුන්වා ඇති ෆින්ලන්ත අධ්‍යාපන පද්ධතිය කෙසේ යොදා ගත හැකි දැයි පිළිබඳව මග පෙන්වීමට ය. ඊට අමතරව, ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්බන්ධීකරණය කරන ලද ආරම්භයක් ලෙස, 2023 වර්ෂයේ සිට පාසල් පද්ධතියේ ක්‍රියාත්මක විය යුතු නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව ෆින්ලන්ත අධ්‍යාපන කණ්ඩායමක්, අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් ද පවත්වන ලදි.
- කොවිඩ් 19 වසංගතය හමුවේ පාසල් වසා දැමීම නිසා නිවසට සීමා වූ පාසල් දරුවන්ගේ අධ්‍යාපනය බිඳ නොවැටී, යම්තාක් දුරකට හෝ පවත්වාගෙන යාමට හැකිවන අයුරින් ඒ ඒ විෂයන් යටතේ "නිවස පාදක ඉගෙනුම් ක්‍රියාකාරකම්" (Home Based Learning) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී සකස් කිරීම.
- වසර දෙකකට ආසන්න කාලයක් පාසල් වසා දැමීම හේතුවෙන් අහිමි වූ ඉගෙනුම (Learning lost) ප්‍රතිසාධනය කර ගැනීමේ අරමුණෙන් අත්‍යවශ්‍ය ඉගෙනුම් අන්තර්ගතයන් හඳුනාගනිමින් ඉගෙනුම් ප්‍රතිසාධන සැලැස්මක් (Learning Recovery Plan) සකස් කිරීම.
- 2015 වර්ෂයේදී පාසල් විෂයමාලාවට කොරියන් භාෂාව හඳුන්වාදෙන ලදී. ශ්‍රී ලාංකිකයන් අතර වැඩිවන ඉල්ලුම සැලකිල්ලට ගනිමින් 2021 වර්ෂයේදී උසස් පෙළ පන්ති දක්වා කොරියන් භාෂාව ක්‍රියාත්මක කරන ලදි.
- ශ්‍රී ලංකාවේ ද්විතීය පාසල්වල කොරියන් භාෂාව උගන්වන ගුරුවරුන්ගේ කොරියන් භාෂා ඉගැන්වීමේ කුසලතා සහ කොරියන් භාෂා කුසලතා උද්දීපනය පිණිස මාර්ගගත පාඨමාලාවක් සැලසුම් කොට ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස "කොරියන් භාෂා ගුරුවරුන් සඳහා වූ මාර්ගගත ශක්‍යතා වර්ධන වැඩසටහන"ට අදාළ පළමු කණ්ඩායම 2021 වර්ෂයේ සාර්ථක ලෙස එම පාඨමාලාව නිම කළේය. වර්ෂයක කාලයක් තුළ ගුරුවරුන් 72ක්

පුහුණු කරන ලද අතර, ගුරුවරු 58ක් එම පාඨමාලාව සාර්ථකව නිම කළහ. මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ කොළඹ, කොරියන් ජනරජයේ තානාපති කාර්යාලයේ සහයෝගීතාව ඇතුවය. එසේම කොරියන් ජනරජයේ තානාපති කාර්යාලයේ ශාස්ත්‍රීය සහය හා මුදල් ආධාර ලැබිණ.

- ශ්‍රී ලංකාවේ කොරියානු අධ්‍යයන ක්ෂේත්‍රයේ අධ්‍යයන විශිෂ්ටත්වය සාර්ථකව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ජයග්‍රහණ සහ දායකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතාට කොරියානු ජනරජයේ නියෝජ්‍ය අග්‍රාමාත්‍යවරයා සහ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සම්මානයක් පිරිනමන ලදි.
- පර්යේෂණ දීමනාව ලබා දීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සහ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා 2014 අංක 02 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව ආයතන සභාව විසින් ලබා දී ඇති විධානයන්ට අනුව ජාතික අධ්‍යාපන ආයතනයෙහි කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ දීමනා ගෙවා ඇත.
- ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලය මගින් සම්පූර්ණ කළ නොහැකි නව විෂයමාලා ප්‍රතිසංස්කරණයට අදාළ අති විශාල කාර්ය ප්‍රමාණය, සපුරා ගැනීම පිණිස දැනට අධ්‍යාපන සේවයේ සිටින ගුරුවරුන් 150ක් බඳවා ගැනීමට අදාළ මූලික වැඩ කටයුතු අවසන් කොට ඇත.

විෂයමාලා සංවර්ධනය

සාමාන්‍ය අධ්‍යාපනය සඳහා විෂයමාලා සංවර්ධනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයකි. ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි. විෂයමාලා සංවර්ධනයට අදාළව පහත සඳහන් ක්‍රියාකාරකම් 2021 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී.

ප්‍රාථමික අධ්‍යාපන

- 1-5 ශ්‍රේණිවලට අදාළව වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (Programme Learning Outcomes) සකස් කිරීම, විෂය ව්‍යාපෘති සටහන්වල කෙටුම්පත් සකස් කිරීම සහ 1 හා 2 ශ්‍රේණි සඳහා විෂය නිර්දේශ 24ක් කෙටුම්පත් කිරීම. ඊට අමතරව 1 ශ්‍රේණියේ පළමු වාරයට අදාළව සකස් කරන ලද මොඩියුල මාර්ගෝපදේශ සහ ක්‍රියාකාරකම් පොත්වල අවසන් කෙටුම්පත් සමාලෝචන කමිටු විසින් අනුමත කරන ලද අතර, දෙවන හා තුන්වන වාර වලට අදාළ මොඩියුල මාර්ගෝපදේශ සහ ක්‍රියාකාරකම් පොත් සකස් කෙරෙමින් පවතී.
- පෙරපාසල් ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශ අත්පොතක් සකසා ඇත. එය පාදක කොට ගෙන මුල් ළමාවිය අධ්‍යාපන නිලධාරීන් 131ක් දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත.

ද්විතීයික අධ්‍යාපනය

- කනිෂ්ඨ ද්විතීයික හා ජ්‍යෙෂ්ඨ දිවිතීයික අවධි සඳහා වැඩසටහන් ඉගෙනුම් ප්‍රතිඵල (Programme Learning Outcomes) සකස් කර ඇත. එම අවධි දෙක සඳහා සැකසූ විෂයමාලා රාමු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.
- 6-9 ශ්‍රේණි සහ 10-11 ශ්‍රේණි සඳහා විෂය ව්‍යාප්ති සටහන් 77ක් සකස් කර ඇති අතර, 6,8 හා 10 ශ්‍රේණි සඳහා විෂය නිර්දේශ 124ක් කෙටුම්පත් කොට ඇත. ඊට අමතරව අත්‍යාවශ්‍ය ඉගෙනුම් මොඩියුල 473ක් සහ වැඩිදුර ඉගෙනුම් මොඩියුල 260ක් සකස් කරමින් පවතී.
- ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථාන කාර්ය මණ්ඩල සාමාජිකයින් 150 දෙනෙකු සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පවත්වා ඇත.
- 6-11 ශ්‍රේණි සමාජ විද්‍යා ගුරුවරුන්ගේ මෘදු කුසලතා සහ සමාජ සංහිඳියාව වැඩි දියුණු කිරීම සඳහා වූ පුහුණු අත්පොතේ අවසාන කෙටුම්පතෙන් 60%ක් සම්පූර්ණ කිරීම.
- වාණිජ විෂයට අදාළ (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) පාරිභාෂික ශබ්ද කෝෂයේ අවසන් කෙටුම්පත සකස් කොට ඇත.
- 9 ශ්‍රේණිය සිංහල සහ 6 ශ්‍රේණිය දෙමළ සඳහා වූ ක්‍රියාකාරකම් පොත් ප්‍රතිශෝධනය කරන ලදි.
- ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 83 දෙනෙකු සඳහා සෞන්දර්ය අධ්‍යාපනයට අදාළ අතිරේක මොඩියුලය සම්බන්ධයෙන් ධාරිතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
- විනෝදාත්මක ක්‍රීඩා මගින් සමාජ සංහිඳියාව ගොඩනැගීම උදෙසා, ගුරුවරුන් 60 දෙනෙකුට ක්‍රියාකාරකම් පාදක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ පුහුණු කිරීමේ මොඩියුලයක් සැකසීම.
- මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයන්, නව STMC විෂයමාලාව සහ ශික්ෂණ විද්‍යාව හා තක්සේරුකරණය, ආශ්‍රිත ප්‍රතිලාභ සහ බෝවන රෝග ඇතිවීමේ අවධානම පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය හමුවක් පැවැත්වීම. තව ද නව ප්‍රතිසංස්කරණ පිළිබඳ රූපවාහිනී දැන්වීම් 5ක් සකස් කරමින් පවතී.
- ආයතනය මගින් මෙහෙයවනු ලබන පාඨමාලාවල ගුණාත්මක භාවය සහතික කරනු වස් Cloud campus හඳුන්වා දෙන ලදි.
- යෝජිත විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීමට ආයතන සභාවේ අනුමැතිය ලැබිණි.

පිරිවෙන් අධ්‍යාපනය

- පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කරනු වස් විද්වත් මණ්ඩලයක් පිහිටුවීම.
- පිරිවෙන් විෂයමාලා සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්තියක් සකස් කිරීමට දායක වන පත්‍රිකාවක් සකස් කර අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන අංශයට යොමු කරන ලදි
- පවතින පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ සිදු කරන ලද අධ්‍යනයේ වාර්තාව සම්පූර්ණ කිරීම.

ද්වි භාෂා අධ්‍යාපනය

- විෂයමාලා ප්‍රතිපත්ති රාමුව වැඩිදියුණු කිරීම.
  - ✓ ජාතික විෂයමාලා රාමුවට අදාළව ලිපි ලේඛන 06ක් සහ එක් සටහනක් සම්පූර්ණ කොට ඇත.
  - ✓ ද්වි භාෂා අධ්‍යාපනය සඳහා අන්තර් දෙපාර්තමේන්තු උපදේශක මණ්ඩලයක් ස්ථාපිත කොට ඇත.
  - ✓ ග්‍රන්ථ අනුවර්තනයට අදාළව මාර්ගෝපදේශයක්, පුහුණුකරුවන් සඳහා අත්පොත් 05ක් ද ඇතුළත්ව සකස් කොට පද්ධතියේ අත්හදා බලා ඇත.
  - ✓ සම්පත් දායකයින් 18 දෙනෙකුගෙන් සමන්විත සංචිතයක් පිහිටු වීම.

- ද්වි භාෂා අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම්, නිරාවරණය කිරීම් හා ප්‍රචාරණය
  - ✓ අන්තර්ජාතික සඟරාවක එක් ලිපියක් ප්‍රකාශයට පත් කොට ඇත.
  - ✓ පර්යේෂණ යෝජනාවක් සම්පූර්ණ කිරීම.

- පිරිවෙන් ද්වි භාෂා වැඩසටහනට සහාය වීම.
  - ✓ මොඩියුල 18ක දෙවැනි කෙටුම්පත් සකස් කරන ලද අතර, ඉන් මොඩියුල 05ක් සම්පූර්ණ කිරීම.
  - ✓ ද්වි භාෂා අධ්‍යාපනය පිළිබඳ භික්ෂූන් වහන්සේලා 300නමක් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් 03ක් පැවැත්වීම.
  - ✓ පිරිවෙන් අධ්‍යාපනයට සම්බන්ධ බලධාරීන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් 03ක් පැවැත්වීම.
  - ✓ පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධ සහායක ලේඛනයක් සකස් කිරීමට ශාස්ත්‍රීය සහාය ලබා දීම.
  - ✓ පිරිවෙන් ද්වි භාෂා විෂයමාලා රාමුව සකස් කිරීම

- ද්වි භාෂා අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ සංස්කෘතියක් සංවර්ධනය කිරීම.
  - ✓ ජාතික විද්‍යා පීඨවලට අදාළව කරනු ලබන අධ්‍යයනයේ දත්ත අර්ථනිරූපණය අවසන් කර ඇත.

ගුරු ගෙදර රූපවාහිනී වැඩසටහන

2021 දී ජාතික අධ්‍යාපන ආයතනයේ YouTube නාලිකාවට ග්‍රාහකයින් මිලියන 15.6 ක් දායක වී ඇත. 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය ඉලක්ක කරගනිමින් පහත සඳහන් රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කර ඇත.

වැඩසටහනේ නම	සකසන ලද වැඩසටහන් සංඛ්‍යාව	රූපවාහිනියේ විකාශය කරන ලද වැඩසටහන් සංඛ්‍යාව	ජා.අ.ආ. චැනලයට යොමු කරන ලද වැඩසටහන් සංඛ්‍යාව
උසස් පෙළ සඳහා රූපවාහිනී වැඩසටහන්	1599	9160	4750
6-11 ශ්‍රේණි සඳහා රූපවාහිනී වැඩසටහන්	2387		
1-5 ශ්‍රේණි සඳහා රූපවාහිනී	1457		

වැඩසටහන්			
ජය නැණ වැඩසටහන්	12	1908	12
ජාතික අධ්‍යාපන චැනලය මගින් ජය නැණ වැඩසටහන්	11	12	40
මුහුණුපොත මගින් රූපවාහිනී වැඩසටහන්	100	25	80 හෝ 50

2021 වර්ෂයේ දී කරන ලද වෘත්තීය සංවර්ධන පාඨමාලා

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව, විෂයමාලා සම්බන්ධ දෙපාර්තමේන්තු කිහිපයක් සහ මීපේ අධ්‍යාපන කළමනාරකණ පීඨය මගින් ගුරුවරුන්, ගුරු අධ්‍යාපනඥයින්, අධ්‍යාපන පරිපාලකයින් සහ අධ්‍යාපන කළමනාකරුවන්ගේ වෘත්තීයභාවය වර්ධනය කිරීම සඳහා අධ්‍යාපනපති පාඨමාලාවේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පාඨමාලා 26ක් දිවයින පුරා විහිදුණු ප්‍රාදේශීය මධ්‍යස්ථාන රැසක් ද කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

පාඨමාලාවේ නම	වගකීම දරන දෙපාර්තමේන්තුව	සහභාගී වූ සංඛ්‍යාව
පශ්චාත් උපාධි පාඨමාලා		
අධ්‍යාපන දර්ශනපති පාඨමාලාව	ගුරු අධ්‍යාපන	36
අධ්‍යාපනපති පාඨමාලාව	ගුරු අධ්‍යාපන	257
අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව	අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන	110
අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව (වර්ෂ 2)	අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන	490
කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති (වර්ෂ 1)	අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන	171
පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා		
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	ගුරු අධ්‍යාපන	3850
පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ පිළිබඳ ඩිප්ලෝමා (පූර්ණකාලීන යන අර්ධකාලීන) පාඨමාලාව	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යා. කළමනාකරණ	474
උපාධි පාඨමාලා		
අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ගෞරව)	ගුරු අධ්‍යාපන	703
අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (සාමාන්‍ය)	ගුරු අධ්‍යාපන	3210
අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව (ඉංජිනේරු)	ගුරු අධ්‍යාපන	196
ඩිප්ලෝමා පාඨමාලා		
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ඉංග්‍රීසි	14
පූර්ව ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	ප්‍රාථමික අධ්‍යාපනය	57
විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	91
සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	28
උපදේශනය පිළිබඳ හා මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය	72
අතිරේක භාෂා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	ගුරු අධ්‍යාපන	100
අධ්‍යාපනපති තක්සේරුකරණය සහ ඇගයීම් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	විභාග	52
පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	වෘත්තීය සංවර්ධන සහ අධ්‍යා. කළමනාකරණ	257
සහතික පත්‍ර පාඨමාලා		
බ්‍රේල් පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	අන්තර්කරණ අධ්‍යාපන	30

ඉහත සඳහන් පාඨමාලා වලට අමතරව, විෂයමාලා ප්‍රතිසංස්කරණ සමග සමපාත වන පරිදි වෘත්තීය සංවර්ධන පාඨමාලා යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වෘත්තීය සංවර්ධනයට අදාළ පහත සඳහන් අනෙකුත් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදි.

- අධ්‍යාපන නායකත්ව සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව සඳහා පාඨමාලා අත් පොතක් සැකසීම.

- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා පාඨමාලා ද්‍රව්‍ය 9ක් පිළියෙළ කිරීම.
- ද්විතීයික විෂයමාලා ප්‍රතිසංස්කරණය මත පදනම් ව උපදේශන නායක්තවය පිළිබඳ පුහුණු මොඩියුලය සංවර්ධනය කර පුහුණුකරුවන් 465ක් සහ විදුහල්පතිවරුන්, සහකාර විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන කළමනාරකරුවන් 2450 දෙනෙකු පුහුණු කරන ලදි.
- අධ්‍යාපනපති උපාධියට අදාළව විෂයමාලා 3ක් සහ පාඨමාලා යෝජනාව සංශෝධනය කර ඇත.
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවට අදාළව වැඩසටහන් ව්‍යුහය සංශෝධනය කිරීම.
- පාසල් වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවට අදාළ පාඨමාලා යෝජනාව සහ විෂය නිර්දේශවල කෙටුම්පත් සැකසීම.
- අතිරේක භාෂා සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා ලිවීම, කියවීම, ශ්‍රවණය සහ කථනයට අදාළ ඉගෙනුම් ද්‍රව්‍ය සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා 03න්ම සැකසීම.
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව (පූර්ණ කාලීන හා අර්ධ කාලීන) සඳහා පාඨමාලා ද්‍රව්‍ය සිංහල මාධ්‍යයෙන් කෙටුම්පත් කර ඇත.
- පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා පාඨමාලා ද්‍රව්‍ය සිංහල මාධ්‍යයෙන් කෙටුම්පත් කිරීම.
- ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පිළිබඳ ඩිප්ලෝමාව සඳහා විෂය නිර්දේශ 6ක පළමු කෙටුම්පත් ද, අවසාන කෙටුම්පත් 6ක් ද සැකසීම.
- පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ තේමා පාදක සහතික පත් පාඨමාලාවක් නිර්මාණය කර ඇත.

පූර්ව සේවා ගුරු අධ්‍යාපනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මගින් පවත්වනු ලබන පූර්ව සේවා ගුරු අධ්‍යාපන වැඩසටහන්වල විෂයමාලා සංවර්ධනය කිරීම මෙන්ම ගුරු විද්‍යාල හරහා සේවාස්ථ ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමත් ජාතික අධ්‍යාපන ආයතනයට අයත් වගකීමකි. ඒ අනුව 2021 වසරේ දී මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කාර්ය ආයතනය විසින් ඉටුකර ඇත

- වෘත්තීය සංරචකයට අදාළ විෂය නිර්දේශවල පළමු කෙටුම්පත් 20ක් ද සාමාන්‍ය සංරචකයට අදාළ විෂය නිර්දේශවල අවසන් කෙටුම්පත් 10ක් ද සම්පූර්ණ කර ඇත. ඊට අමතරව විශේෂ සංරචකයට අදාළව විෂය නිර්දේශ 12ක පළමු කෙටුම්පත් සකස් කරමින් පවතී. තව ද අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන සඳහා ආදර්ශ ක්‍රියාකාරකම් 175ක් සකස් ඇත.
- විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල වෙනුවෙන් අධ්‍යයන සැසි 04ක් පවත්වා ඇත.
- නුපුහුණු ගුරුවරුන් සඳහා වූ සහතික පත්‍ර පාඨමාලාවට අදාළ සම්මුඛ සැසි සහ ප්‍රායෝගික ඉගැන්වීම් (දෙවන අදියර) පවත්වා ඇති අතර ගුරුවරුන් 592 දෙනෙකු අවසන් විභාගයට සහභාගී වී ඇත.

- PRINSET පාඨමාලා, ගුරු පුහුණු මධ්‍යස්ථාන හා දුරස්ථ අධ්‍යාපන පාඨමාලා අසමත් වූ හෝ ඌන සාමාර්ථ සහිත ගුරුවරුන් 290ක් නැවත ඇගයීමට ලක් කරන ලදි.

අන්තර්කරණ අධ්‍යාපන

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා යෝග්‍ය වන පරිදි විෂයමාලාව අනුවර්තනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන් සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- අන්තර්කරණ අධ්‍යාපන ක්ෂේත්‍රයේ 280 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ජාතික සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- තොරතුරු තාක්ෂණ විෂය සඳහා ගුරු පුහුණු අත් පොතක් සකස් කිරීම.
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් 16 දෙනෙකු හඳුනා ගැනීම සහ එවැනි දරුවන් තක්සේරු කිරීම සඳහා වූ උපකරණ කට්ටලයෙන් 50%ක් කෙටුම්පත් කිරීම.
- බ්‍රේල් අධ්‍යාපනය සම්බන්ධ අත් පොතක් කෙටුම්පත් කිරීම.
- මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ප්‍රධාන ධාරාවේ මොඩියුල 2ක් (10 ශ්‍රේණිය ගණිතය හා 8 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය) සමාලෝචනය කරන ලදි.
- ප්‍රධාන ධාරාවේ සිටින ගුරුවරුන් (සිංහල හා දෙමළ) සඳහා විශේෂ අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ මාර්ගෝපදේශ මාලාවක් සහ පාඩම් 10ක් සකස් කර ඇත.

මාර්ගෝපදේශන හා උපදේශන සේවා

අධ්‍යාපන ප්‍රජාවගේ මානසික අවශ්‍යතා සපුරාලීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශන ඒකකය ස්ථාපිත කරන ලදි. පාසල් පාර්ශ්වකරුවන්ට වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන සේවා සැපයීමේ වගකීම මෙම ඒකකය සතු වේ. පහත ක්‍රියාකාරකම් 2021 දී නිම කරන ලදි.

- පාසල් දරුවන් 28 දෙනෙකු හා ඔවුන්ගේ දෙමාපියන් උදෙසා ගෘහස්ථ උපදේශන සැසි පැවැත්වීම.
- වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළව මොඩියුල 8ක් කෙටුම්පත් කර ඇත.
- මාර්ගගත පදනම හා ජංගම යෙදුම් (mobile app) ලෙස භාවිත කිරීම සඳහා වෘත්තීය පරීක්ෂණ (වෘත්තීයා ලැදියා පරීක්ෂණ, වෘත්තීය හැකියා පරීක්ෂණ, වෘත්තීය ප්‍රමුඛතා පරීක්ෂණ, පෞරුෂය මැනීමේ පරීක්ෂණ) සංවර්ධනය කරන ලදි.

විවෘත පාසල

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගී කර ගනිමින් අධ්‍යාපනය

ඉගෙනුම්ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාට ම අධ්‍යාපනය ලබා දීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම්ලාභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කරගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි.

විවෘත පාසල් ඒකකය විසින් විවෘත ඉගෙනුම සම්බන්ධව 2021 වර්ෂයේ දී ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

- විවෘත පාසල් පාඨමාලාවල උගන්වනු ලබන උපදේශකවරුන් සඳහා ලබා දීමට සකස් කරන වෘත්තීය අන්තර්මාරුවට අදාළ මාර්ගෝපදේශයේ කෙටුම්පත් සකස් කිරීම.
- උපදේශකවරුන් 43 දෙනෙකු සඳහා මාර්ගගතව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- අමුණුකුඹුර, සීදුව, වත්තේගම සහ තෝලංගමුව යන ප්‍රදේශවල නව විවෘත පාසල් ඉගෙනුම් මධ්‍යස්ථාන ස්ථාපිත කරනු ලැබූ අතර හැටන් හි පිහිටි මධ්‍යස්ථානය ප්‍රතිව්‍යුහගත කරන ලදි.
- සාක්ෂරතා, පදනම් සහ ද්විතීයික පාඨමාලා හදාරන පාඨමාලා ලාභීන් 987 දෙනෙකු සඳහා උපකාරක ඉගෙනුම් සැසි 40ක් පැවැත්වීම.
- මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් 7ක් මාර්ගගතව පැවැත්වූ අතර සීදුව සහ අමුණුකුඹුර යන ප්‍රාදේශීය ඉගෙනුම් මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම.
- විවෘත පාසල් වැඩසටහනෙහි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ක්‍රියාවට නැංවීම සඳහා පහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ අතර අවසන් වාර්තාව කැනඩාවේ පොදුරාජ්‍ය මණ්ඩලීය ඉගෙනුම් ආයතනය වෙත ඉදිරිපත් කිරීම.

    - ✓ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට ගැළපෙන පරිදි සාක්ෂරතා පාඨමාලා සහ පදනම් පාඨමාලාව ප්‍රතිශෝධනය කරන ලදි.
    - ✓ මොඩියුල 2ක් (සිංහල භාෂාව සහ නිවස හා ප්‍රජාව) ප්‍රතිශෝධනය කරන ලදි.
    - ✓ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ සකස් කරන ලද පුහුණු අත්පොත මත පදනම්ව ගුරුවරුන් 54 දෙනෙකු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
    - ✓ ප්‍රාදේශීය ඉගෙනුම් මධ්‍යස්ථානවල යටිතල පහසුකම් හා උපදේශකවරුන් බඳවා ගැනීමට සම්බන්ධ භූමිතිරි බව පිළිබඳ මාර්ගෝපදේශය සංශෝධනය කිරීම.

අධ්‍යාපන කෞතුකාගාරය

ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ ප්‍රධාන සංරක්ෂණ මධ්‍යස්ථානය වේ. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට අදාළ ඓතිහාසික වැදගත්කමක් ඇති ප්‍රදර්ශක, වටිනා වස්තූන් සහ තොරතුරු එහි තැන්පත් කර ඇත. මෙම එකතුවෙහි ඔරලෝසුව, ජාතික ඇඳුම, අත්අකුරු පිටපත් ආදී ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර මහතාගේ අනුස්මරණ භාණ්ඩ, ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයේ විෂයමාලා ද්‍රව්‍ය, අධ්‍යාපන චක්‍රලේඛ, ඉගැන්වීම්-

ඉගෙනුම් ද්‍රව්‍ය සහ පැරණි ලේඛනමය උපකරණ සොයාගත හැකිය. තවද, 2021 දී පහත එකතු කිරීම් සිදු කර ඇත.

- ප්‍රදර්ශන භාණ්ඩ 03ක් සංරක්ෂණය කිරීම හා ප්‍රදර්ශන භාණ්ඩ එකතුවට අදාළව වාර්තා 20ක් හා කාඩ්පත් 02ක් අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇත.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ ඓතිහාසික දැනුම ව්‍යාප්ත කරනු වස් ජාතික අධ්‍යාපන ආයතනයේ කෞතුකාගාරය සංවර්ධනය කිරීම සඳහා ප්‍රදර්ශන පුවරු 02ක් සකස් කරන ලද අතර, බිත්ති සිතුවම් කිරීම ද සිදුවෙමින් පවති.
- බෞද්ධ අධ්‍යාපන යුගයේ භාවිතා වූ සුතත්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම පිළිබඳ සකස් කරන ලද e-book හි කෙටුම්පත සකස් කිරීම.

පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය ආයතනයේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයට අමතරව, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සහ ගුරු අභ්‍යාස විද්‍යාලවල ගුරුවරුන් හා සිසුන් මෙන්ම අනෙකුත් අධ්‍යාපනවේදීන් විසින් අධ්‍යයන කටයුතු සඳහා භාවිත කරයි.

- පුස්තකාල පද්ධතිය ස්වයංක්‍රීය කිරීම සඳහා පවතින දත්ත 500කට වඩා ඇතුළත් කර නව මෘදුකාංග ස්ථාපනය කර ඇත.
- කර්තෘ ප්‍රකාශන 443ක් සහ තවත් පොත් 112ක් මිලදී ගෙන ඇත.

පර්යේෂණ හා සංවර්ධන

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම, අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදය සඳහා සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීම තුළින් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2021 දී නිම කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- "යෝජිත විෂයමාලාව සඳහා පාසල් ප්‍රජාවගේ සූදානම පිළිබඳ විශ්ලේෂණයට" අදාළ පර්යේෂණ වාර්තාව සම්පූර්ණ කිරීම.
- විද්‍යුත් සඟරා පද්ධතිය (www.nie.research.lk) නිර්මාණය කිරීමට අදාළ කාර්යයන් නිම කිරීම සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනඥයින් සඳහා ජාත්‍යන්තර සඟරා ප්‍රකාශන වේදිකාවක් නිර්මාණය කිරීමට කතුවැකි සහ සමාලෝචන මණ්ඩලයක් පිහිටුවීම.
- ඵලදායී පර්යේෂණ අධීක්ෂකවරුන් බවට පත් කිරීම සඳහා ආයතනයේ නිලධාරීන් 140 දෙනෙකු සඳහා මාර්ගගත පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- පර්යේෂණ ප්‍රදාන ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ වාර්තා 2ක් සම්පූර්ණ කිරීම සහ 3වන පර්යේෂණ ප්‍රදාන ලාභියාට පර්යේෂණ වාර්තාව සම්පූර්ණ කිරීම සඳහා මාස 6ක කාලයක් දිර්ඝ කිරීම.
- සී.ඩබ්.ඩබ්. කන්නන්ගර අනුස්මරණ දේශනය, දැනුම පරිණාමය ලෙස උරුමය ; ශ්‍රී ලංකාවේ පශ්චාත් ශිලා යුගයේ පුරා විද්‍යාව යන මැයෙන් කැළණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව මහතා විසින් 2021 ඔක්තෝම්බර් 13වන දින පවත්වන ලදි.

සැලසුම් හා ඇගයීම්

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව කටයුතු කිරීම සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.

2021 වසරේ සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

- 2020 වර්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව (ඉංග්‍රීසි) සකස් කිරීම.
- උපාය මාර්ගික කළමනාකරණ සැලැස්ම (2022 -2026) සකස් කිරීම.
- 2022 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව, අයවැය වාර්තාව සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- 2021 වාර්ෂික සැලැස්ම හා අයවැය සංශෝධනය කිරීම.
- 2021 වර්ෂයට අදාළ දේශීය හා විදේශීය මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියාමනය සඳහා කාර්තුමය ප්‍රගති වාර්තා 4ක් හා මාසික මූල්‍ය වාර්තා 8ක් සකස් කිරීම.
- වෙනත් ආයතන වෙත ඉදිරිපත් කිරීමට පහත සඳහන් ප්‍රගති වාර්තා සකස් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමට ප්‍රගති වාර්තා දෙකක් සකස් කිරීම.
- UNICEF, GEMP සහ ADB යනාදී විදේශීය මුල්‍යාධාර ආයතන වලට ඉදිරිපත් කිරීමට කාර්තුමය ප්‍රගති වාර්තා 04ක් සකස් කිරීම.

කාර්ය මණ්ඩල සංවර්ධන

ආයතනයේ සියලුම විදේශීය ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව සම්බන්ධීකරණය කිරීමේ වගකීම බාහිර සම්පත් කළමනාකරණ ඒකකය සතු වේ. පසුගිය අවුරුදු පහක කාලය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ඉවහල්වන දිර්ඝ කාලීන හා කෙටි කාලීන විදේශීය පාඨමාලා රැසක් සඳහා අවස්ථා සම්පාදනය කර දෙන ලදී.

2021 වර්ෂයේ ළඟා කරගත් කාර්ය සාධනය පහත පරිදි වේ :

- 2022 - 2023 කාල පරිච්ඡේදය සඳහා වෘත්තීය සංවර්ධන සැලැස්මක් සකස් කිරීම, වෘත්තීය සංවර්ධනය පිළිබඳ සිදු කරන ලද අවශ්‍යතා සමීක්ෂණ වාර්තාව සම්පූර්ණ කිරීම සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාළ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.

- UNESCO ආයතනයට අනුබද්ධිත අධ්‍යාපන සැලසුම්කරණ පිළිබඳ අන්තර්ජාතික ආයතනයේ පුහුණු වැඩසටහනක් සඳහා ආයතනයේ නිලධාරීන් දෙදෙනකු සඳහා අවස්ථාව සැපයීම සහ දේශීය විශ්වවිද්‍යාලයන්හි ආචාර්ය උපාධි 2ක්, ශාස්ත්‍රපති උපාධි 3ක් පශ්චාත් අධ්‍යාපන උපාධි ඩිප්ලෝමාවක් හැදෑරීම සඳහා මූල්‍ය ආධාර සපයා ඇත.

පරිපාලනය

ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්ය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පරිපාලන දෙපාර්තමේන්තුව මගින් සිදු කරයි.

- ඉහළ කළමනාකරණ කාණ්ඩයට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදි. අනෙක් කාණ්ඩ අනුමැතිය සඳහා යොමුකර ඇති අතර, සංශෝධන සඳහා සාකච්ඡා පවත්වා ඇත.
- පහත සඳහන් උසස්වීම් සඳහා කටයුතු කර ඇත.
    - ✓ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් 06
    - ✓ අධ්‍යක්ෂ 10
    - ✓ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 06
    - ✓ කථිකාචාර්ය 04
    - ✓ කාර්මික සහකාර 03
    - ✓ කළමනාකරණ සහකාර 13
- පහත සඳහන් බඳවා ගැනීම් සඳහා කටයුතු කර ඇත.
    - ✓ අධ්‍යක්ෂ 01
    - ✓ සහකාර අධ්‍යක්ෂ 01

- විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට සමගාමීව වැටුප් හා දීමනා ඉහළ නැංවීම සඳහා, කැබිනට් පත්‍රිකාවේ කෙටුම්පත, අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.
- In Design පාඨමාලා 4ක් ප්‍රසම්පාදන පාඨමාලාවක් Graphic පාඨමාලාවක් ඇතුළත්ව කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන් 06ක් පවත්වන ලදි.
- වාහන සමූහයක් නඩත්තු කරගෙන යනු ලැබේ.

මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව, විෂයමාලා ද්‍රව්‍ය සහ අධ්‍යාපනික ද්‍රව්‍ය මුද්‍රණය කිරීම, පළාත් /කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තු හරහා පාසල් වෙත නොමිලේ නිකුත් කරනු ලබන පොත් බෙදාදීම, පළාත් මට්ටමින් පොත් ප්‍රදර්ශන පැවැත්වීම, සහභාගී වීම සහ ජාතික අධ්‍යාපන ආයතන පරිශ්‍රයේ පොත් සාප්පුව පවත්වාගෙන යාම සිදු කරයි.

මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ග

- අමතර විෂයමාලා ද්‍රව්‍ය - 54
- සහතික - 14
- සඟරා - 05
- ආරාධනා පත්‍ර - 01
- ෆයිල් කවර - 03
- සම්පත් පොත් - 03
- වෙනත් ප්‍රකාශන - 46

ඉහත සඳහන් කළ මුද්‍රිත ද්‍රව්‍යවලට අමතරව මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව මුද්‍රණ සැලැස්මක් සහ ව්‍යාපාර සැලැස්මක් සකස් කර ඇත. ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රකාශන අලෙවි කරන පොත් සාප්පුවෙන් රු. මිලියන 24ක ආදායමක් උපයා ඇත.

මූල්‍ය සේවා

මුදල් දෙපාර්තමේන්තුව ආයතනයේ සියලුම කාර්යයන් සඳහා මූල්‍ය සම්පත් සපයන අතර මූල්‍ය නීති රීති අනුව ආදායම් හා වියදම් වාර්තා පවත්වාගෙන යයි.

- ස්ථාවර වත්කම් ලේඛනයෙන් 75%ක් සකස් කොට සම්පූර්ණ කිරීම.
- 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සම්පූර්ණ කිරීම.
- 2020 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- ආයතනයේ භාවිතයට ගත නොහැකි අයිතම වලට අදාළව ඉවත් කිරීමේ ක්‍රියාපටිපාටියෙන් 40%ක් සම්පූර්ණ කිරීම.
- ටෙන්ඩර් මණ්ඩල වලට අදාළ කාර්යයන් සපුරා ඇත.
- ප්‍රාග්ධන භාණ්ඩ මිළදී ගැනීමේ කාර්යයන් වලින් 80%ක් නිමකොට ඇත.
- පවත්නා වර්ෂයේ අත්තිකාරම් ලේඛන සැසඳීමේ කටයුතුවලින් 80%ක් සම්පූර්ණ කිරීම.
- ගබඩාවට අදාළ වැඩකටයුතු වලින් 95%ක් නිමකොට ඇත.

ඉංජිනේරු සේවා හා නඩත්තු

ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යාම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලැබේ. ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂයේ දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්ය පහත දැක්වේ.

- මීපේ පරිශ්‍රයෙහි ඇති ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණයට අදාළ කාර්යන් වලින් කොටසක් නිම කිරීම.

- මීපේ දකුණු ආසියානු ප්‍රාදේශීය ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ (SARTDC) නේවාසිකාගාර සංකීර්ණයේ ඉතිරි වැඩකොටසින් 90% ක් සම්පූර්ණ කිරීම.
- කාර්ය මණ්ඩලය සඳහා වූ මහරගම පරිශ්‍රයෙහි තෙමහල් නේවාසිකාගාර සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර ඇත.
- ජාතික අධ්‍යාපන ආයතනයේහි දිවා සුරැකුම් මධ්‍යස්ථානය ඇතුළුව පෙරපාසල් ගොඩනැගිල්ල පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අවසන් කිරීම.
- මීපේ පරිශ්‍රයෙහි අංක 12 ගොඩනැගිල්ලේ පුනරුත්ථාපනයට අදාළ කටයුතු, ගොඩනැගිලි අංක 14හි පොදු වැසිකිළිය ප්‍රතිසංස්කරණය කිරීම, මීපේ ප්‍රධාන ගේට්ටුව සහ ආරක්ෂක කාමරය ප්‍රතිසංස්කරණය කිරීම, ජනන යන්ත්‍ර කාමරය සහ මහරගම පරිශ්‍රයේ ට්‍රාන්ස්ෆෝමර් කාමරය ඉදිකිරීම, අංක 13 ගොඩනැගිල්ලේ සිවිලිම ප්‍රතිසංස්කරණය කිරීම, ගොඩනැගිලි අංක 7හි කොන්ක්‍රීට් වහලය ජල ආරක්ෂණය කිරීම, ගොඩනැගිලි අංක 19 අසල ඇති අභ්‍යන්තර ජලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම සහ ගොඩනැගිලි සහ වැහයන් හි හදිසි නඩත්තු කිරීම ආදිය අවසන් කිරීම.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No.	HED/A/NIE/FA/2021	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2022 ජූලි 11 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික අධ්‍යාපන ආයතනය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ ව්‍යාපෘති 04 කට අදාළ එකතුව රු.1,801,121 ක් වූ අතරැඳවුම් මුදල් ප්‍රාග්ධනීත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ආයතනයට ලැබී තිබුණු රු.176,008,097 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙලිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) ආයතනය විසින් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය අනුව පාඨමාලා ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කරන බව දක්වා තිබුණ ද පාඨමාලා ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. නියැදි පරීක්ෂාවට භාජනය කරන ලද පාඨමාලා 02 ක සමාලෝචිත වර්ෂයට අදාළ පාඨමාලා ආදායම රු. 6,968,250 ක් වුවද 2020 හා 2022 වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ එකතුව රු.4,488,750 ක පාඨමාලා ගාස්තුද සමාලෝචිත වර්ෂයට ගලපා තිබීම නිසා රු.11,457,000 ක් වර්ෂයේ පාඨමාලා ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදීගෙන තිබූ පිරිවැය රු.3,027,020 ක් වූ පරිගණක මෘදුකාංගයේ වටිනාකම අස්පෘෂ්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධනීත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස කපාහැර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම වැඩියෙන් හා අස්පෘෂ්‍ය වත්කම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කරනු ලැබේ. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නියා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම **පිණිස** අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය සඳහන් අවශ්‍යතාවයන් අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (ඇ) යටතේ දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට ආයතනයට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ වල්ට යටත්ව යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10.1 වගන්තිය	ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව ජාතික අධ්‍යාපන ආයතනය මගින් නිකුත් කරන ලද 1996 මාර්තු 26 දිනැති අංක 179 දරන අභ්‍යන්තර චක්‍රලේඛයක් පදනම් කරගෙන දළ වැටුප මත 1/20 දීමනා ගෙවා තිබුණි.

(ආ) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4 (ක) සහ 28 වගන්ති

සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය අනුමත කරගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කාර්තව්‍ය හා කාර්යයන්ට අනකූල නොවන ලෙස කටයතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමත කාර්යමණ්ඩලය තුල ඇති නීති නිලධාරි තනතුර පුරප්පාඩු වී පැවතිය දී අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවන නීති සම්බන්ධිකාරක තනතුර සඳහා 2020 නොවැම්බර් 02 දින සිට නිලධාරියෙකු පත්කර තිබූ අතර ඔහු වෙනුවෙන් එදින සිට සාමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.952,550 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) 2017 හා 2019 වර්ෂයන්ට අදාළව පර්යේෂණ ප්‍රදාන 09 ක් වෙනුවෙන් රු.8,020,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද පර්යේෂණ ප්‍රදාන 07 ක් වෙනුවෙන් රු.2,274,970 ක් පමණක් වැය කර තිබුණි.

(ඇ) දෙස් විදෙස් ගුරු සිසුන් 100 දෙනෙකුට නේවාසික පහසුකම් ලබා දීමේ අරමුණින් 2015 අයවැය යෝජනාවක් මත රු.මිලියන 198 ක ඇස්තමේන්තු පිරිවැයකින් යුක්තව ඉදිකරගෙන යනු ලබන මීපේ දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2019 දෙසැම්බර් 05 දින වන විට නිමකළ යුතුව තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවස්ථා 06 කදී දින දීර්ඝ කිරීම් ලබා දී තිබියදී වාර්තාවේ දිනය දක්වාම ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. තවද මෙම ඉදිකිරීම් කටයුතු කරගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය වාර්තාවේ දිනය දක්වා ලබා ගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික අධ්‍යාපන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් වාර්තාව

1.2 **තත්ත්වාගණනය කල මතය සඳහා පදනම**

(අ) මෙය අනපසුවීමකින් සිදු වී ඇති බව නිරීක්ෂණය වන බැවින් 2022 වර්ෂයට අදාළ මූල්‍ය වාර්තාවල ජ'නල් සටහන් මඟින් නිවැරදි කරනු ලබන අතර 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2021ට අදාළව යලි ප්‍රකාශිත මූල්‍ය වාර්තාවල මෙය නිවැරදි කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟවන ලදී.

(ආ) ආයතනයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම සිදු කිරීමට ඉදිරි ගිණුම් වර්ෂයේ සිට කටයුතු කරන බව මුදල් දෙපාර්තමේන්තුව මඟින් මාවෙත වාර්තා කර ඇත.

ඒ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය වාර්තාවල අවශ්‍ය හෙලිදරව් කිරීම් සිදු කිරීමට පියවර ගනු ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව වාර්ෂිකව භාණ්ඩාගාරය මඟින් ලබා දෙන ප්‍රාග්ධන ප්‍රධාන ආයතනයේ අයභාර ආදායම් ලෙස ගිණුම්ගත කිරීම සම්බන්ධව ඉදිරියේ දී ජාතික විගණන කාර්යාලය මඟින් ලිඛිත උපදෙස් ආයතනය වෙත ලබා දෙන බව විගණන අධිකාරී සඳහන් කරන ලදී.

එම ලිඛිත උපදෙස් අනුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම මුදල් දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ යුතුය.

(ඇ) ජාතික අධ්‍යාපන ආයතනය මඟින් පවත්වනු ලබන විවිධ පාඨමාලා සඳහා ගුරු සිසුන් ගාස්තු ගෙවීම් කරනු ලබන්නේ ලංකා බැංකුවේ ජාතික අධ්‍යාපන ආයතනය නමින් ඇති ගිණුමටය.

ඒ අනුව ආයතනය විසින් පාඨමාලා ආදායම් ගිණුම්ගත කිරීම කරනු ලබන්නේ පාඨමාලා ආදායම් පිළිබඳව බැංකුවෙන් ලැබෙන බැංකු ගිණුම් විස්තරය අනුව ලැබී ඇති තොරතුරු හා රිසිට් පත් අනුවය. සියලුම රිසිට්පත් සමහර බැංකු ශාඛා මඟින් ලබා නොදීමත් සමහර රිසිට්පත්වල අදාළ තොරතුරු සටහන් නොවීමත් හේතුවෙන් බැංකු ගිණුම් විස්තරය අනුව ලැබී ඇති ආදායම රිසිට් පත් සමඟ සැසඳීම දුෂ්කර වී ඇත. අප විසින් බැංකුව වෙත සියලුම රිසිට්පත් ලබා දෙන ලෙස නිරන්තරයෙන් දැන්වුව ද බැංකුව පවසා සිටින්නේ සියලුම ශාඛාවන්ගෙන් අදාළ රිසිට්පත් නිසි ලෙස නොලැබෙන බව ය.

සියලුම රිසිට්පත් ලබා දෙන ලෙස ආයතනය විසින් ලංකා බැංකුව වෙත ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත (ඇමුණුම 01).

තව ද ගුරු සිසුන් විසින් බැංකුව වෙත මුදල් තැන්පත් කරනු ලබන වවුචරය නිවැරදිව සම්පූර්ණ නොකිරීම ද සියලු පාඨමාලා ගාස්තු නිවැරදිව හඳුනා ගැනීම ගැටලු සහගත වී ඇත. පාඨමාලාලාභීන් විසින් තැන්පත්

කරනු ලබන සියලුම මුදල් අදාළ ජංගම ගිණුමට බැරවන බැවින් එහි සඳහන් ලැබීම් අවසන් ගිණුම්වල පාඨමාලා ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂය තුළ ලැබුණු ආදායම නිවැරදි බව තහවුරු වේ.

ආයතනය විසින් ලංකා බැංකුව වෙත දන්වා ඇති පරිදි ලංකා බැංකුව විසින් පාඨමාලා ගාස්තු ගෙවීම සඳහා පරිගණක ගෙවීම් ක්‍රමයක් එනම් T4S Pannel දැනටමත් සකස් කරමින් පවතින අතර ඒ අනුව ඉදිරියේ දී පාඨමාලා ගාස්තු නිවැරදිව බැංකුව වෙත අදාළ නොරතුරු සහිතව ලැබෙන බැවින් දැනට සිදුවන ගැටලු නිරාකරණය කර ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් මෙහෙයවනු ලබන සියලු පාඨමාලා සඳහා 2022 වර්ෂයට අදාළ පාඨමාලා ගාස්තු, ලද පාඨමාලා ගාස්තු, ලැබිය යුතු පාඨමාලා ගාස්තු, ඉදිරියට ලද පාඨමාලා ගාස්තු කොපමණ ද යන්න පිළිබඳ නිරවද්‍ය වාර්තාවක් පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම දැනට විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨයේ සේවය කරනු ලබන අධ්‍යක්ෂ (මුදල්) විසින් සිදු කළ යුතුය.

මෙහි නිරවද්‍යතාවය තහවුරු කිරීමේ වගකීම මුදල් දෙපාර්තමේන්තුව සතුවේ.

(ඈ) මෙම පරිගණක මෘදුකාංගයේ වටිනාකම අතපසුවීමකින් වර්ෂයේ වියදම් ලෙස කපා හැරීමෙන් වූ වරද 2022 වර්ෂයේ ජ 'නල් සටහන් මඟින් නිවැරදි කර 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී 2021ට අදාළ යලි ප්‍රකාශිත මූල්‍ය වාර්තාවල නිවැරදි කරනු ලැබේ.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟවන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2 (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10.1 වගන්තිය**

ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට අතිකාල ගෙවීම සම්බන්ධයෙන් සහකාර කමිකරු කොමසාරිස් විසින් අංක සීඑස්/8/1/617/94 දරන හා 1995.03.22 දිනැති ලිපිය මඟින් කර ඇති නියෝගය පරිදි ජාතික අධ්‍යාපන ආයතනය 1954 අංක 19 දරන සාජ්පු හා කාර්යාල සේවක පනතේ සේවා නියුක්තිය හා පාරිශ්‍රමික විධිමත් කිරීමේ විධි විධාන ක්‍රියාත්මක කිරීමට නෛතිකව බැඳී ඇති අතර එම පනතේ ව්‍යවස්ථාපිත හිමිකම් මත සති අන්ත නිවාඩු, වැටුප් සහිතව උපයා ගන්නා ආකාරය පැහැදිලි කර ඇත.

ඒ අනුව අතිකාල ගෙවීමේ දී ජීවන වියදම් දීමනාවද අදාළ කර ගත යුතු බව දන්වා ඇත (ඇමුණුම 02).

ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනය විසින් පාලන චක්‍ර ලේඛ අංක 179 මඟින් දක්වා ඇත්තේ 1/20 දීමනාව ගෙවීමේ දී ද වැටුපට ජීවන වියදම් දීමනාව අනුව තීරණය කරනු ලබන දීමනාවන් ඇතුලත් වූ මුලු වැටුපට අනුව ගණනය කරන ලෙසය (ඇමුණුම 03).

එසේම මේ සම්බන්ධයෙන් නීතිපතිගේ අංක E/149/2020/NIE හා 2021.10.04 දිනැති ලිපියෙහි 4 ඡේදය මඟින් ද දක්වා ඇත්තේ 1/20 දීමනාව ගෙවීම සම්බන්ධයෙන් අදාළ වූ ජාතික අධ්‍යාපන ආයතනයේ 179 චක්‍රලේඛය අනුව වැටුපට ජීවන වියදම් දීමනාව අදාළ කර ගෙන කටයුතු කිරීම නීත්‍යානුකූල බවය (ඇමුණුම 04).

ජාතික අධ්‍යාපන ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයේ 6 වන පරිච්ඡේදයේ 17.5 හි 1/20 දීමනාව ලබා ගත හැකි බව දක්වා ඇත. එසේම දැනට ආයතන සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇති යාවත්කාලීන කරනු ලැබූ එම පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහයේ මෙම දීමනාව ලබා ගැනීමේ දී වැටුපට ජීවන වියදම් දීමනාව ද අදාළ කරගෙන ගණනය කල යුතු ලෙස සඳහන් වේ.

තව ද ජාතික අධ්‍යාපන ආයතනයේ අනිකාල සඳහා හිමිකම් කියන සේවකයින්ගේ අතිකාල දීමනා ගණනය කිරීමේදී ද 'පාරිශ්‍රමිකය' යන්නට වැටුප් හෝ වේතනයට ජීවන වියදම අනුව තීරණය කරනු ලබන විශේෂ දීමනාව ද ඇතුලත් කර ගණනය කිරීම නිවැරදි හා නීත්‍යානුකූල ක්‍රමය වන්නේ නම්, එකම ආයතනයේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන්ට රජයේ නිවාඩු දින සහ සති අන්ත දිනවල සේවයේ යෙදීම සම්බන්ධයෙන් 1/20 දීමනාව ගෙවීම සම්බන්ධයෙන් ද අදාල කර ගත යුතු 'පාරිශ්‍රමිකය' වන්නේ වැටුප හෝ වේතනයට ජීවන වියදම අනුව තීරණය කරනු ලබන දීමනාද ඇතුලත් මුළු පාරිශ්‍රමිකය බව පැහැදිලිය. එසේ නොවන්නේ නම් එකම ආයතනයේ සේවකයින් දෙපිරිසකට ආකාර දෙකක් අනුව පාරිශ්‍රමිකය ගණනය කළා යැයි තීරණය දෝෂ දර්ශනයට ලක්විය හැකි අතර සේව්‍ය සේවක ආරවුල් ඇතිවීම සහ සේවකයින් විසින් ඒ මත නීති ක්‍රියාමාර්ග ගැනීමට යොමු වීමට ද හැකියාව ඇත.
එහෙයින් මීට අදාළව යොමුකර තිබූ විගණන විමසුමෙන් දක්වා තිබූ අදාළ නිලධාරීන් දෙදෙනාටද 1/20 දීමනාව ඉහත සඳහන් කළ නීත්‍යානුකූල ප්‍රතිපාදනවලට අනුකූලව ඉතාමත් නිවැරදි ආකාරයට අර්ථ නිරූපනය කර ගෙවීමට කටයුතු කර ඇත,
'පාරිශ්‍රමිකය' යන්න හැම විටම එකම පදනමක්/අර්ථ නිරූපනයක් මත අදාළ කර ගත යුතු බව අවධාරණය කළ යුතු අතර, 2006 - 2015 කාලය තුළ දී ජාතික අධ්‍යාපන ආයතනයෙන් සේවක අර්ථසාධක අරමුදලට බැර විය යුතු මුදල් ගණනය කිරීමේ දී වැටුප යන්නට ජීවන වියදම් දීමනාව අදාළ කර නොගැනීම නිසා කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝගය පරිදි හිඟ මුදල් ද සමඟ අධිභාර ලෙස රුපියල් මිලියන හැත්තෑවකට ආසන්න මුදල් ප්‍රමාණයක් ජාතික අධ්‍යාපන ආයතනයට සේවක අර්ථසාධක අරමුදලට ගෙවීමට සිදු වී ඇති බව ද තවදුරටත් දන්වා සිටින අතර එසේ විශාල පාඩුවක් සිදුව ඇත්තේ නීත්‍යානුකූල නොවන ආකාරයට අදාළ ගෙවීම් සිදු කර ඇති බැවිනි.

තව ද අදාළ විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති ආකාරයට මූලික වැටුප මත පමණක් සාවද්‍ය ලෙස 1/20 දීමනාවට අදාළ ගණනය කිරීම තුළින් අගතියට පත්වන සේවකයින් විසින් 1/20 දීමනාව පාරිශ්‍රමිකය නිවැරදි ආකාරයට අර්ථ නිරූපණය නොකර නීත්‍යානුකූල නොවන ආකාරයට ගණනය කර ඇතැයි යන පදනමින් නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමුවීමට ද ඉඩකඩ ඇති බව නිති නිලධාරී විසින් වාර්තා කර ඇත

විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය

දැනට ආයතන සභා අනුමැතිය ලබා ගෙන ඇති සංශෝධිත පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED – Department of Public Enterprises) වෙතින් අනුමැතිය ලබා ගැනීම.

(ආ) **1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන පනතේ 4 (ක) සහ 28 වගන්ති**

ජාතික අධ්‍යාපන ආයතනයේ පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය වර්තමානයට ගැලපෙන ලෙස යාවත්කාලීන වූ නීති, රීතීන් මූල්‍ය හා පරිපාලන චක්‍ර ලේඛනයන් හා මූල්‍ය රෙගුලාසි ඇතුළත් කරමින් විශ්‍රාමික නියෝජ්‍ය විගණකාධිපති ඩබ්ලිව්.එම්. විජේපාල මහතා සහ රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික අධ්‍යක්ෂ ආර්. සමරවීර මහතා ඇතුලු විද්වත් කමිටුවක් පත්කොට මේ වන විට කෙටුම්පත් කරන ලද අතර එය ආයතන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

දැනට ආයතන සභා අනුමැතිය ලබා ගෙන ඇති සංශෝධිත පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සංග්‍රහය සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED – Department of Public Enterprises) වෙතින් අනුමැතිය ලබා ගැනීම.

2.3 **වෙනත් කරුණු**

(අ) ආයතනයේ දීර්ඝ කාලයක් සේවයේ නියුතුව සිටි නීති නිලධාරී 2020.11.01 දින විශ්‍රාම ගන්නා ලදී.

විශ්‍රාම ලබා ගන්නා අවස්ථාව වන විට ආයතනයට අදාළව අධිකරණ තුල විභාග වෙමින් පැවති නීති කෘත්‍යයන් රැසක් පැවති අතර, කම්කරු දෙපාර්තමේන්තුවේ විවිධ සේවක ප්‍රශ්නවලට අදාළ පැමිණිලි රාශියක් විභාග වෙමින් පැවතිණි. තව ද අභ්‍යන්තර පරීක්ෂණ මෙන්ම මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි ආදී නීති කෘත්‍යයන් සඳහා නව නිලධාරියෙකු බඳවාගෙන ආයතනය විසින් එම නීති කෘත්‍යයන් නිසි ලෙස නව නිලධාරියාට පවරා දෙන තෙක්, එම කටයුතු භාරව ක්‍රියාකළ නීතිඥවරයාගේ සම්පත් දායකත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වූ බැවින් නීති සම්බන්ධීකාරක ලෙස, සේවය ලබා ගන්නා දිනයන් සඳහා පමණක් ගෙවීම් කිරීම යටතේ එම සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.

මෙම නිලධාරී මහතා විශ්‍රාම ගත් අවධිය මෙන්ම 2021 වසර ඉතා දරුණු ලෙස කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය ව්‍යාප්තව පැවති අතර, පුරප්පාඩු තනතුර සඳහා අයදුම්පත් කැඳවීම හා ඊට අදාළ සෙසු කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට අදාළ පරිසරයක් නොතිබූ බව පෙන්වා දෙන අතරම, ඒ වන විට විභාග වෙමින් පැවති නීති කෘත්‍යයන්, කම්කරු දෙපාර්තමේන්තුව හා අදාළ කාර්යයන්, සේවා ගිවිසුම් සකස් කිරීම වැනි කාර්යයන් බාහිර නීතිඥවරයෙකුගේ සේවය තුළින් ඉටුකර ගැනීමට ඉතා විශාල මුදලක් වියදම් කරනවා වෙනුවට අදාළ කාර්යය සම්බන්ධව දීර්ඝ කාලීන අත්දැකීම් ඇති විශ්‍රාමික නීතිඥවරයා මඟින් ඉටු කර ගැනීම වඩාත් ඵලදායී විය.

එම කාලය තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පැවති නඩු කිහිපයක් ආයතනයට හිතකර වන පරිදි ජයග්‍රහණය කිරීමට හැකිවීම ද ඔහු ඒ සම්බන්ධයෙන් දක්වන ලද කැපවීමේ ප්‍රතිඵලයක් ලෙස සඳහන් කරනු කැමැත්තෙමි.

ප්‍රසිද්ධ පුවත්පත් නිවේදනයක් මඟින් අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව 2021.10.01 දින බඳවා ගැනීමට අදාළ පත්වීම් ප්‍රදානය කළ අතර පත්වීම් භාර ගැනීමට කල් ගැනීමෙන් අනතුරුව 2022.01.07 දින සිට නව නීති නිලධාරිනිය එම තනතුරේ රාජකාරී භාර ගෙන ඇත.

2022.03.07 දින සිට විශ්‍රාමික නීති නිලධාරී ධර්මින් ද සිල්වා මහතාගේ දෛනික සේවය ලබා ගැනීම අවසන් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟවන ලදී.

(ආ) 2016 වර්ෂයේ රු.8,020,000/- ක මුදලක් පර්යේෂණ ප්‍රදාන අයිතම යටතේ වෙන් කර ඇති හෙයින් අභ්‍යන්තර හා බාහිර පාර්ශව සඳහා දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් ලෙස පර්යේෂණ ප්‍රදාන ලබා දීම ආරම්භ කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව 2016 වර්ෂයේ දී පර්යේෂණ ප්‍රදාන ලබා දීම සඳහා අවශ්‍ය ලියකියවිලි සකස් කරන ලදී. ඒ සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ සහ ආයතන සභාවේ (AAB & Council) අවසන් අනුමැතිය ලැබුණේ 2017 වර්ෂයේ දීය . ඒ අනුව වර්ග (Type) 03 ක් යටතේ පර්යේෂණ ප්‍රදාන ලබා දීමට තීරණය විය. (පළමු වර්ගය (Type 01) - මාස 06, දෙවන වර්ගය (Type 02) - වසර 01, තෙවන වර්ගය (Type 03) - වසර 02 ලෙස) තෙවන වර්ගය සඳහා වසර 02 ක කාලයක් ගත වන බැවින් පර්යේෂණ ප්‍රදාන ලබා දීම වසරක් හැර වසරක් බැගින් සිදු කරන ලදී. ඒ අනුව එම වර්ෂයේ දී රු.4,000,000/- (රුපියල් මිලියන හතරක්) ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර පර්යේෂණ ප්‍රදාන පහක් (05) ලබා දීමට අපේක්ෂා කර තිබුණි.

ඒ අනුව 2017 වර්ෂයේ දී පුවත්පත් දැන්වීම් (දිනමිණ, තිනකරන්, Daily News) පළ කර පර්යේෂණ ලබා දීම සඳහා අයදුම්පත් කැඳවන ලද අතර ඉන් ලැබුණු අයදුම්පත් සියල්ල (9) අභ්‍යන්තර ඇගයීමට හා බාහිර ඇගයීමට (පර්යේෂණ විශේෂඥ කමිටු සාමාජිකයින්) ලක් කර ඉන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් පස්දෙනෙකුට පර්යේෂණ පිළිබඳ විශේෂඥ කමිටු සාමාජිකයන් ඉදිරියේ වාචික ඉදිරිපත් කිරීම් (Oral Presentation) සඳහා අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව සුදුසුකම් ලැබූ තිදෙනා 2017.12.30 දින පර්යේෂණ

ප්‍රදාන ලබා දීම සඳහා ආයතනය සමඟ ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ පිළිබඳ විස්තර **උපලේඛන අංක 01** හි දැක්වේ.

එම තිදෙනාගෙන් එක් පුද්ගලයෙකු වසරකින් ද (Type 02 - රු. 500,000/-). අනෙක් පුද්ගලයින් දෙදෙනා වසර දෙකකින් ද (Type 03 - රු. 1,000,000/- බැගින්). පර්යේෂණ නිම කළ යුතු විය.

ඉහත ගිවිසුම් ගත වූ තිදෙනාට හිමි මුදල අදියර 4කින් ප්‍රගතිය පරීක්ෂා කිරීමෙන් අනතුරුව, පළමු අදියරේ සම්පූර්ණ ගෙවීම් ලෙස රු. 375,000/- ක මුදලක් (රු.500,000/- හිමි පුද්ගලයාගෙන් 15% ක් වූ රු.75,000/- මුදල ක් රු.1,000,000/- හිමි පුද්ගලයෙකුගෙන් 15% බැගින් රු. 150,000/- බැගින් පුද්ගලයින් දෙදෙනාගෙන් රු.300,000/-ක් බැගින් මුලු මුදල රු. 375,000/-ක් පමණක් 2017 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දී ලබා දෙන ලදී.

ඉතිරි මුදල වූ රු. 2,125 ,000/- (රු.500,000/- හිමි පුද්ගලයාගේ ඉතිරි මුදල වන රු. 425,000/- ත්, රු.1,000,000/- බැගින් හිමි පුද්ගලයන් දෙදෙනාගෙන් ඉතිරි මුදල වන රු.850,000/- X 2 = 1,700,000) ඉදිරි වර්ෂයට ගෙන යන ලදී. ඒ අනුව 2017 වසරේ සියලු වියදම් විස්තරය **උපලේඛන අංක 02** හි දැක්වේ.

2017 වර්ෂයේ පර්යේෂණ ප්‍රදානලාභීන් තිදෙනා ඔවුන්ගේ පර්යේෂණ 2019 වර්ෂයේ අග භාගය වන විට නිමකළ යුතු බැවින්, දෙවන වර පර්යේෂණ ප්‍රදාන ලබා දීම 2019 දී සිදු කරන ලදී.

ඒ අනුව 2019 වර්ෂයේ නැවත පුවත්පත් දැන්වීමක් මඟින් පර්යේෂණ යෝජනා සඳහා අයදුම්පත් කැඳවන ලදී. 2019 වර්ෂයට අයදුම්පත් 17 ක් ලැබුනු අතර ඒවා ද ඉහත සඳහන් ක්‍රියාපටිපාටියට අනුගතව ඇගයීම් සිදුකොට සුදුසුකම් ලැබූ සිව් දෙනෙකු (Type 02 - රු.500,000/-) තෝරා ගන්නා ලද අතර ඔවුන් ආයතනය සමඟ 2019.09.27 දින ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ පිළිබඳ විස්තර **උපලේඛන අංක 03** හි දැක්වේ.

ඔවුන් සිය පර්යේෂණ 2019 වර්ෂයේ සැප්තැම්බර් මස ආරම්භ කර 2020 සැප්තැම්බර් මස නිම කළ යුතු වුවත් පාස්කු ප්‍රහාරය සහ රටේ පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත දත්ත රැස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ඔවුන්ගේ පර්යේෂණ නිමකර වාර්තා ආයතනය වෙත භාරදෙන ලද්දේ 2021 වර්ෂයේ දීය. ඒ අනුව 2019 වර්ෂයේ සියලුම වියදම් විස්තරය **උපලේඛන අංක 04** දක්වා ඇත.

මේ වන විට 2017 වර්ෂයේ දී පර්යේෂණ ආරම්භ කළ තිදෙනාටම තම පර්යේෂණ නිම කිරීම වෙනුවෙන් ඔවුන්ට හිමි රු.2,500,000/- ක මුදල ලබා දී අවසානය.

තව ද 2019 වර්ෂයේ දී පර්යේෂණ ආරම්භ කළ සිව්දෙනාට ද පර්යේෂණ නිම කිරීම වෙනුවෙන් ඔවුන්ට ගෙවීමට නියමිත රු.2,000,000/- ක මුදලින් රු.1,700,000/- ක මුදලක් මේ වන විට ලබා දී අවසානය. ඉතිරි රු.300,000/- ක මුදල පර්යේෂණ ප්‍රදානලාභී වෛද්‍ය සිරිල් ජූඩ් මාතන්රාජ් මහතාගේ ඉල්ලීම මත ඔහුගේ පර්යේෂණය නිම කිරීමේ කාලය දීර්ඝ කිරීම වෙනුවෙන් මෙම වසරේදී (2022) ඔහුට ලබා දීමට නියමිතය.

තව ද 2018 වර්ෂයේ දී පර්යේෂණ ප්‍රදාන ලබා දීමට සමගාමීව සංකතෘක පර්යේෂණයක් ද ආරම්භ කර මේ වන විට නිමකර අවසානය. ඒ සඳහා රු.1,055,630/- ක මුදලක් ද වැය විය. එම පර්යේෂණය ද පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය යටතේම ක්‍රියාත්මක විය.

2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සෑම වර්ෂයකම පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතියේ සියලුම වියදම් **උපලේඛන අංක 05** මඟින් දක්වා ඇත.

මේ අනුව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් වන පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ රු.5,854,654/- ක මුදලක් වැය වී ඇත.

ඒ අනුව රු.8,020,000/- න් රු.2,165,346/-ක මුදලක් ඉතිරි වී ඇත. එම ඉතිරි මුදල සඳහා ද 2022 වර්ෂයේ දී පර්යේෂණ ප්‍රදාන ලබා දීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකර අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව අයදුම්පත් 07 ක් ලැබුණු අතර ඒවා අභ්‍යන්තර ඇගයීමට හා බාහිර ඇගයීමට ලක්කර (පර්යේෂණ විශේෂඥ කමිටු සාමාජිකයින්) ඉන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් පස්දෙනෙකුට පර්යේෂණ විශේෂඥ කමිටු සාමාජිකයන් ඉදිරියේ වාචික ඉදිරිපත් කිරීම් (Oral Presentation) සඳහා අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුව පර්යේෂණ ප්‍රදාන ලබා දීම සඳහා සුදුසුකම් ලැබුවේ තිදෙනෙක් පමණි.

එම නිදෙනා ජාතික අධ්‍යාපන ආයතනය සමඟ 2022.08.03 වන දින පර්යේෂණ ප්‍රදාන ලබා දීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලදී. 2022 වර්ෂයේ පර්යේෂණ ප්‍රදාන ලබා දුන් පුද්ගලයින්ගේ විස්තර **උපලේඛන අංක 06** මඟින් දක්වා ඇත.

එම නිදෙනාම තම පර්යේෂණ වසරකින් නිම කළ යුතුය. ඔවුන්ට හිමි පළමු අදියරේ ගෙවීම් ලෙස රු. 225,000/- ක මුදලක් 2022.08.03 දින ලබා දෙන ලදී (රු.500,000/- න් 15% ක් වූ රු.75,000/- බැගින් පුද්ගලයින් නිදෙනාටම රු. 225,000/-). දෙවන අදියරේ ගෙවීම් නොවැම්බර් මස ගෙවීමට නියමිතය. (රු.500,000/- න් 25% ක් වූ රු.125,000/- බැගින් පුද්ගලයින් නිදෙනාටම රු. 375,000/-).

තෙවන හා සිව්වන අදියරේ ගෙවීම් (30% + 30%) ඉදිරි වර්ෂයේ දී ගෙවීමට නියමිතය. (රු.500,000/- න් 60% ක් වූ රු.300,000/- බැගින් පුද්ගලයින් නිදෙනාටම රු. 900,000/-). තව ද 2021 වර්ෂයේ දී කාලය දීර්ඝ කරන ලද වෛද්‍ය සිරිල් ජූඩ් මාතන්රාජ් මහතාට හිමි රු.300,000/- ක මුදල ද මෙම වසරේ දී ගෙවීමට නියමිතය.

2022 වර්ෂය තුළ දී මේ දක්වා කරන ලද ගෙවීම් පිළිබඳ විස්තරය **උපලේඛන අංක 07** මඟින් ඉදිරිපත් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

ඉහත පිළිතුර සමඟ කමිටුව එකඟවන ලදී.

(ඇ) මීට අදාළ පැහැදිලි කිරීම **උපලේඛන අංක 08** මඟින් ඉදිරිපත් කර ඇත.

මෙම ඉදි කිරීම සම්බන්ධව පැහැදිලි කිරීමක් අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) විසින් විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලදී. මේ වනවිට මෙම කොන්ත්‍රාත්තුවේ 94% වැඩ අවසන් කර ඇති බව ද සඳහන් විය.

විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශය

මෙතරම් කාල පමාවක් සිදු වී ඇත්තේ කොන්ත්‍රාත්තුවේ වැඩ පිළිබඳ ඉංජිනේරු අංශය විසින් නිසි පරිදි පසු විපරමි කිරීමක් සිදු නොවීමේ හේතුවෙන් බව කමිටුවේ අදහස විය.

ඉදිරි කොන්ත්‍රාත් කටයුතුවලදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන පරිදි කටයුතු කල යුතු බව.

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න
අධ්‍යක්ෂ ජනරාල්

උපලේඛන 01 :2017 වර්ෂයේ පර්යේෂණ ප්‍රදාන ලබා දුන් පුද්ගලයින්ගේ විස්තර

නම	පර්යේෂණ ප්‍රදාන වර්ගය	නිම කල යුතු කාලය	මුදල රු
ශ්‍යාමලී ඊරියගම මිය	Type 02	වසර 01	500,000/-
I.කයිලාසපති මයා	Type 03	වසර 02	1,000,000/-
Dr. A.M. ජයිල් මයා	Type 03	වසර 02	1,000,000/-

උපලේඛන 02 :2017 වර්ෂයේ සියලු වියදම් විස්තරය පහත වගුවේ දැක්වේ.

විස්තරය	**මුදල රු.**
පුවත්පත් දැන්වීම් සඳහා	80,500/-
වැඩමුලු සඳහා	72,000/-
පර්යේෂණ ප්‍රදානලාභීන් සඳහා (රු. 500,000/- X 15% = රු. 75,000/-) (රු. 1,000,000/- X 15% X 2 = රු. 300,000/-)	375,000/-
එකතුව	**527,500/-**

උපලේඛන 03 :2019.09.27 වන දින පර්යේෂණ ප්‍රදාන ලබා ගත් පුද්ගලයින්ගේ විස්තර

නම	පර්යේෂණ ප්‍රදාන වර්ගය	නිම කල යුතු කාලය	මුදල රු
මහාචාර්ය චන්ද්‍රා ගුණවර්ධන	Type 02	වසර 01	500,000/-
මහාචාර්ය දයාලතා ලේකම්ගේ	Type 02	වසර 01	500,000/-
ආචාර්ය සූජීවා පොල්ගම්පල	Type 02	වසර 01	500,000/-
වෛද්‍ය සිරිල් ජූඩ් මාතන්රාජ්	Type 02	වසර 01	500,000/-

උපලේඛන 04 : 2019 වර්ෂයේ සියලුම වියදම් විස්තරය

විස්තරය	**මුදල** රු
පර්යේෂණ ප්‍රදානලාභීන් සඳහා	1,200,000/-
පර්යේෂණ ප්‍රදාන වැඩමුලු සඳහා	173,420/-
සංකනාක (collaboration) පර්යේෂණ වැඩමුලු සඳහා	374,050/-
එකතුව	**1,747,470/-**

උපලේඛන 05: 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘතියේ සියලු වියදම් විස්තරය පහත දක්වා ඇත.

(RS)

Year	Expected research grantees	Actual research grantees	Expenditure					
			Grant			Expenditure for the research		Total expenditure
			Payment for the grantees	Advertisement	Workshops	other	workshops	
2016	-	-	-		29 000	-	-	29 000
2017	5	3	375 000	80 500	72 000	-	-	527 500
2018	-	-	625 000	77 624	62 830	665 980	15 600	1 447 034
2019	4	4	1 200 000	-	173 420	374 050		1 747 470
2020	-	-	1 250 000	-	31 650	-	-	1 281 650
2021	-	-	750 000	-	72 000	-	-	822 000
			4 200 000	158 124	440 900	1 040 030	15 600	5 854 654

උපලේඛන 06 : 2022 වර්ෂයේ පර්යේෂණ ප්‍රදාන ලබා දුන් පුද්ගලයින්ගේ විස්තර

නම	පර්යේෂණ ප්‍රදාන වර්ගය	නිම කල යුතු කාලය	මුදල රු
එස්.එම්.ඩී.කුමාරි	Type 02	වසර 01	500,000/-
මහාචාර්ය ආර්.එම්.මුදියන්සේ	Type 02	වසර 01	500,000/-
ශරීනා දිල්රුක්ෂා හුසේන්	Type 02	වසර 01	500,000/-

උපලේඛන 07 : 2022 වර්ෂයේ මේ දක්වා ගෙවීම් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

විස්තරය	**මුදල රු.**
ප්‍රවත්පත් දැන්වීම් සඳහා	70,092/-
වැඩමුලු සඳහා	42,480/-
පර්යේෂණ ප්‍රදානලාභීන් සඳහා (රු. 500,000/- X 15% X 3= රු. 225,000/-)	225,000/-
එකතුව	**337,572/-**

ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව,

ජාතික අධ්‍යාපන ආයතනය,

මහරගම.

2022.09.16

අධ්‍යක්ෂ ජනරාල්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහය සේවා) මඟින්,

මීපේ දඹුණු ආසියානු කලාපීය ගුරු සංවර්ධන මධ්‍යස්ථානය සඳහා යෝජිත නේවාසිකාගාර පහසුකම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම - කොන්ත්‍රාත් අංක (CE– 532)

විගණන වාර්තාවේ විගණන 3 (ඇ) ඡේදය සම්බන්ධව වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

ව්‍යාපෘති විස්තර

- සේවා යෝජකයා : ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
- සේවා යෝජක නියෝජිත : අධ්‍යක්ෂ ජනරාල් (ජාතික අධ්‍යාපන ආයතනය)
- ඉංජිනේරු : අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා) ජාතික අධ්‍යාපන ආයතනය
- කොන්ත්‍රාත්කරු : RN Construction (Pvt) Ltd
- ආරම්භක දිනය : 2018.01.04
- නිම කිරීමට නියමිතව තිබූ දිනය : 2019.01.03
- කොන්ත්‍රාත් කාලය දින 365

කාලය දීර්ඝ කිරීම

කල් දිගුවේ නිමිකම් අංකය	හේතුව	බලපෑම් කාලය	දීර්ඝ කල කොන්ත්‍රාත් කාලය	කාල සීමාව
01	අත්තිවාරම් දැමීමේ උත්සවයේ ප්‍රමාදයන් සහ ආරම්භක අවදියේදී භූමියේ තිබූ අනපේක්ෂිත වෙනස්කම් (Unforseable Physical Conditions)	03.01.2018 09.02.2018	04.01.2019 07.02.2019	දින 35
02	ආරම්භක අවධියේදී අපේක්ෂා කල නොහැකි භූමියේ වෙනස්කම් (Unforseable Physical Conditions) ඉදිකිරීම් කර්මාන්තයේ අර්බුද, අයහපත් කාලගුණික තත්ත්වය, අනපේක්ෂිත පරිදි ද්‍රව්‍ය හා ශ්‍රමය සැපයීමේ දුෂ්කරතා	09.02.2018 07.02.2019	07.02.2019 15.12.2019	දින 311
03	පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයේ බලපෑම අනපේක්ෂිත පරිදි ද්‍රව්‍ය හා ශ්‍රමය සැපයීමේ දුෂ්කරතා.	07.02.2019 15.12.2019	15.12.2019 15.10.2020	දින 305
04	Covid 19 අවදානම් තත්ත්වය හේතුවෙන්, අධි අවදානම් ප්‍රදේශයක වැඩ කිරීමට ඇති අකමැත්ත චලනය සීමා කිරීම.	15.12.2019 15.10.2020	15.10.2020 30.03.2021	දින 166

කල් දිගුවේ හිමිකම් අංකය	හේතුව	බලපෑම් කාලය	දීර්ඝ කල කොන්ත්‍රාත් කාලය	කාල සීමාව
05	Covid 19 අවදානම් තත්ත්වය හේතුවෙන් ද්‍රව්‍ය සැපයුමේ හිඟය ආදී ප්‍රවාහන සීමා කිරීම් ආදිය.	15.10.2020 30.03.2021	31.03.2021 30.06.2021	දින 92
06	Covid 19 අවදානම් තත්ත්වය හේතුවෙන් ද්‍රව්‍ය සැපයීමේ දුෂ්කරතා සහ සේවක සංඛ්‍යාව ඉහළ අගයක් ගනී.	31.03.2021 30.06.2021	30.06.2021 30.11.2021	දින 153
කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇති මුළු දින ගණන		04.01.2019 30.06.2021	30.06.2021 30.11.2021	දින 1062

කොන්ත්‍රාත්තුවේ CIDA / SBD 4 / 8.4 උප වගන්තියට යටත්ව වැඩ සඳහා කලය දීර්ඝ කිරීම ලබාදිය හැක.

- මුල්ගල තැබීමේ උත්සවය සඳහා සේවා යෝජකයා විසින් ප්‍රමාද කිරීම හේතුවෙන් පළමු කල් දිගුව ලබාදී ඇත.

- දෙවන කල් දිගුව : (බලපෑමට ලක් වූ කාල සීමාව 09.02.2018 - 07.02.2019) :

මූල්‍ය ප්‍රගතිය 17% ක් වන අතර එය අපේක්ෂිත ප්‍රගතියට වඩා බෙහෙවින් අඩු වුවද පහත සඳහන් ප්‍රතිලාභ සේවා යෝජකයාට ලැබී ඇත.
ආරම්භක අවධියේදී අපේක්ෂා කල නොහැකි භූමියේ වෙනස්කම් (Unforseable Physical Conditions) ඉදිකිරීම් කර්මාන්තයේ අර්බුද,
අයහපත් කාලගුණික තත්ත්වය,
අනපේක්ෂිත පරිදි ද්‍රව්‍ය හා ශ්‍රමය සැපයීමේ දුෂ්කරතා

- තුන්වන කල් දිගුව : (බලපෑමට ලක්වූ කාලය 07.02.2019 - 15.12.2019)

පාස්කු ඉරිදා ප්‍රහාරය සහ ඉදිකිරීම් කර්මාන්තයේ පරිහානිය බොහෝ ඉදිකිරීම් කටයුතුවලට දැඩි ලෙස බලපෑවේය. කොන්ත්‍රාත්කරු ඒ වන විට ව්‍යපෘතියෙන් 29% ක මූල්‍ය ප්‍රගතියක් පෙන්වා ඇති අතර එයට අත්තිවාරම සැ ව්‍යුහාත්මක කටයුතු ඇතුලත් වේ. වැඩ ප්‍රමාදය හේතුවෙන් ඉංජිනේරුවරයා විසින් 2019.08.01 දින ව්‍යාපෘතිය අවසන් කිරීමට (Intention for termination) ලිපියක් නිකුත් කර ඇති අතර, කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය ගැටළු හේතුවෙන් ප්‍රමාදයන් සිදු වී ඇත.

තවද පහත කරුණු හේතුවෙන්ද ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු අපේක්ෂිත ප්‍රගතිය පෙන්වීමට අපොහොසත් වී ඇත.

(අ) ප්‍රමාද ගාස්තු අය කිරීම.

(ආ) ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල වැඩිවීම නිසා සිදුවන පාඩු

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශය මුදල් ලබා නොදීම නිසා අතරමැදි ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ මූල්‍යමය හැකියාව පහත වැටීම.

(ඈ) පාස්කු ප්‍රහාරය හේතුවෙන් ප්‍රමාදයන්

(ඉ) අනපේක්ෂිත කාලගුණික වෙනස්වීම්

ඉහත මූල්‍ය ප්‍රශ්නය සහ සේවා යෝජකයාට වන පිරිවැය සහ කාල ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීමට තීරණය කරන ලදී.

- හතරවන, පස්වන සහ හයවන කල් දිගු (බලපෑමට ලක්වූ කාලය 15.12.2019 - 30.06.2021) 2019 දෙසැම්බර් මාසයේදී Covid 19 ගෝලීය වසංගතය පැතිරීම සහ 2020 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව එහි බලපෑමට ලක්වී ඇත. රජය විසින් මෙම කාල සීමාව තුල නිරෝධානය ඇදිරි නීතිය සහ ගමන් සීමා කිරීම් පනවා ඇරි බැවින්, මෙම කාල සීමාවේදී වැඩ කරන කාලය මාස 06 කට වඩා අඩුය. Covid 19 වසංගතය සහ සංචාරක සීමාවන් සැලකිල්ලට ගනිමින් කල් දිගුව ලබා දී ඇත.
- කොන්ත්‍රාත්කරුට කාලය දීර්ඝ කිරීම ලබා දී නොමැති නම්, කොන්ත්‍රාත්තුව අවසන් කරනු ලැබේ. එවිට සේවා යෝජකයාට නව ගිවිසුමකට යා යුතුය. ඉදි කිරීම් ද්‍රව්‍යවල මිල උච්චාවචනය වීම හේතුවෙන් ව්‍යාපෘතිය ප්‍රමාද වන අතර අමතර වියදම් දැරීමට සිදුවේ. ව්‍යාපෘතිය 2017 මිල ගණන් අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති අතර එය මේ දක්වා 100% කට වඩා වැඩි වී ඇත. මූල්‍ය ප්‍රතිලාභය සේවා යෝජකයාට ලැබී ඇත.
- නව කොන්ත්‍රාත්තුවක් පූර්ව කොන්ත්‍රාත් ක්‍රියාවලිය සඳහා අමතර කාලය සහ පිරිවැය අවශ්‍ය වේ. තව ද මෙම ව්‍යාපෘතිය නිර්මිත ඉදි කිරීම් (Design & Build) ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා නිසි ප්‍රමාණ පත්‍රිකාවක් (BOQ) නොමැති බැවින් සේවා යෝජකයාට ගෘහ නිර්මාණ ශිල්පියෙකුගෙන්, විදුලි ඉංජිනේරු ජලනල නිර්මාණකරුවෙකුගෙන්, ව්‍යුහාත්මක සැලැසුමක් සහ ප්‍රමාණ සමීක්ෂණයකින් ඉනිරි වැඩ ප්‍රමාණය කිරීමට අවශ්‍ය වේ. එය සේවා යෝජකයාට අමතර වියදමක් වනු ඇත.
- මූලික පිරිවැය කොන්ත්‍රාත්කරු වෙත ගෙවා ඇති අතර ඊළඟ කොන්ත්‍රාත්තුව සඳහා අමතර මූලික පිරිවැයක් ගෙවීමට සිදුවේ.
- කොන්ත්‍රාත්කරු ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) C1 ශ්‍රේණිගත කොන්ත්‍රාත්කරුවෙකි. කොන්ත්‍රාත්කරුට මෙම කාර්යය කිරීමේ හැකියාව පවතී.
- [illegible] සේවා යෝජකයාට පිරිවැය සහ කාල ප්‍රතිලාභය සලකා බැලීමෙන් කල් දිගුව (EOT) ලබා දී ඇත.

අද වන විට (2022 අගෝස්තු 30) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය 88% වන අතර කොන්ත්‍රාත්කරුට 2021.11.30 දිනෙන් පසු කල් දිගුවක් ලබා දී නොමැත. ප්‍රමාද ගාස්තු දැනට අය කර ගෙන ඇත.

නිර්මිත ඉදිකිරීම් ක්‍රමවේදය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමට අවකාශයක් නොමැත. නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය අදාළ සැලසුම් මත වෙනස් වේ. කොන්ත්‍රාත්කරු නාගරික සංවර්ධන අධිකාරියේ මාර්ගෝපදේශයට සැලසුම් කිරීම සඳහා වගකිව යුතු අතර අනුමැතිය සඳහා ලේඛන ඉදිරිපත් කල යුතුයි.

සේවා යෝජකයා ගෙවීම් සහ අනෙකුත් සේවා යෝජක ලියකියවිලි සකස් කල යුතුය. කොන්ත්‍රාත්කරු නාගරික සංවර්ධන අනුමැතිය ලබා ගෙන ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට එකඟ වී ඇත. (ඇමුණුම බලන්න) ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති අතර එය අද දක්වා ලැබී නොමැත. කෙසේ වෙතත්, මේ වන විට නැවතත් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය සඳහා නව ලේඛනය ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා)

අ-01

ජාතික අධ්‍යාපන ආයතනය
தேசிய கல்வி நிறுவகம்
NATIONAL INSTITUTE OF EDUCATION

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மகரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka

අපේ යොමුව: / எமது கோவை: / *Our Reference:* NIE/Investment/2022

ඔබේ යොමුව: / தங்கள் கோவை: / *Your Reference:*

දිනය: / திகதி: / *Date:* 2022.06.23

කළමණාකරු
ලංකා බැංකුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

පාඨමාලා වලට ලද මුදල් සඳහා ලදුපත් ලබාගැනීම.

ජාතික අධ්‍යාපන ආයතනයේ එක් එක් පාඨමාලා වෙනුවෙන් ගුරු සිසුන් වෙනුවෙන් දිවයින පුරා ඇති ලංකා බැංකු ශාඛා මඟින් තැන්පත් කරනු ලබන සියළු මුදල් වෙනුවෙන් නිකුත් කරනු ලබන ලදුපත් දෙනිකව නිකුත් කරනු ලබන බැංකු ගිණුම් විස්තරය (Bank Statement) සමඟ නොලැබෙන බැවින් විගණන අවශ්‍යතා සඳහා අදාල ලියවිලි ඉදිරිපත් කල නොහැකි වීමෙන් දැඩි දුෂ්කරතාවයට මුහුණ දීමට සිදුව ඇත.

එබැවින් මේ පිළබඳ ඔබගේ කඩිනම් අවධානය යොමු කොට සියළුම ලංකා බැංකු වෙත තැන්පත් කරන ලද මුදල් වෙනුවෙන් නිකුත් කරනු ලබන ලදුපත් සියල්ල දෙනිකව එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

මේ සම්බන්ධයෙන් ලැබෙන ඔබගේ සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ.ඩබ්ලිව්.බී.එම්.පී. විජේසුන්දර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා)
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පිටපත්:
1. විගණක අධිකාරී - රජයේ විගණන කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් பணிப்பாளர் நாயகம் Director General (011) 7601621
කාර්යාලය அலுவலகம் Office (011) 7601601
ෆැක්ස් பெக்ஸ் Fax (011)7601800 (011)7601700
I.D.D. Code +94-1
වෙබ් අඩවිය இணையதளம் Website www.nie.lk
ඊ මේල් ஈ-மெயில் E mail info@nie.edu.lk

Annexe - A (1)

මගේ අංකය: සීඑස්/8/1/617/94

ඔබේ අංකය: ජා.ආ/පා.මු/පා.ප්‍රේ/2/15

දකුණු කොළඹ කම්කරු කාර්යාලය,
6 වන මහල
කම්කරු මහා ලේකම් කාර්යාලය.
කොළඹ.05
1995.03.22 දිනදී

අනුප්‍රේම 02

24-3-1995

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
පරිගණක හා පිරිස් සේවා දෙපාර්තමේන්තුව ඇතුළත
තැ.පෙ.21
මහරගම.

මහත්මයානෙනි,

ජාතික අධ්‍යාපන ආයතනය එදිරිවීව
නිදහස් සේවක සංගමය.

